| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය (රු.) | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| **2002.02.99** | පොළිය-අනිකුත් | 11,500,000.00 | 10,000,000.00 | 9,941,394.15 | 99.41 % |
| **2003.02.99** | විකුණුම් හා ගාස්තු - විවිධ | 400,000.00 | 100,000.00 | 62,094.47 | 62.09 % |
| **2003.99.00** | විකුණුම් හා ගාස්තු - අනිකුත් ලැබීම | 25,000,000.00 | 50,000,000.00 | 29,881,528.54 | 59.76 % |



## 3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කර ගනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | **මුල් ප්‍රතිපාදනය** | **අවසාන ප්‍රතිපාදනය** | | |
| පුනරාවර්තන | 1,684,000,000 | 1,825,000,000 | 1,785,306,036 | 92.27 % |
| ප්‍රාග්ධන | 184,000,000 | 229,000,000 | 194,231,538 | 80.35 % |



## 3.7 මු.රේ. 208 ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුවවල නියෝජිතයෙක් ලෙස දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු.මිලියන

| අනු අංකය | අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව හා වියදම් විස්තරය/බාණ්ඩය | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තථ්‍ය වියදම | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| 1 | ජනාධිපති ලේකම් කාර්යාලය (001) | ප්‍රජා ඵලදායිතා වැඩිදියුණු කිරීමේ වැඩසටහන (බ.අං.)113) | 1.23 | 1.23 | 0.73 | 0.59 |
| | | අලි සුපෝෂණ කලාපයක් ස්ථාපිත කිරීම (බ.අං.194) | 3.29 | 3.29 | 1.45 | 0.44 |
| | | ක්ලීන් ශ්‍රී ලංකා ජංගම හා විශේෂ ජන සත්කාරක වැඩසටහන (බ.අං.214) | 3.00 | 3.00 | 2.69 | 0.90 |
| | | ඕලන්ද ඇළ ශුද්ධ පවිත්‍ර කිරීමේ ව්‍යාපෘතිය (බ.අං.231) | 0.70 | 0.70 | 0.68 | 0.97 |
| | | වන අලි ඉවත් කිරීමේ මෙහෙයුම (බ.අං.232) | 2.75 | 2.75 | 2.05 | 0.75 |
| | | ප්‍රජා ඵලදායිතා වැඩිදියුණු කිරීමේ වැඩසටහන (බ.අං.261) | 1.90 | 1.90 | 0.20 | 0.10 |
| 2 | මැතිවරණ කොමිෂන් සභාව (020) | පුනරාවර්තන වියදම් | 21.55 | 21.55 | 21.55 | 1.00 |
| 3 | ජාතික විගණන කාර්යාලය (021) | විගණන උප කාර්යාලය අලුත්වැඩියා කරගැනීම | 4.20 | 4.20 | 3.50 | 0.83 |
| 4 | බුද්ධ සාසන සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍යාංශය (101) | දංකොටුව සංස්කෘතික මධ්‍යස්ථානයේ ගේට්ටුව සකස් කිරීම | 0.41 | 0.41 | 0.40 | 0.98 |
| | | පුත්තලම සංස්කෘතික මධ්‍යස්ථානයේ වැසිකිලි පද්ධතිය අලුත්වැඩියාව සහ වැසිකිලිය සඳහා අලුතින් වලක් ඉදිකිරීම | 0.80 | 0.80 | 0.71 | 0.89 |
| | | පල්ලම සංස්කෘතික මධ්‍යස්ථානයේ අලුත්වැඩියාවක් සඳහා | 0.53 | 0.53 | 0.50 | 0.96 |
| | | පුත්තලම සංස්කෘතික මධ්‍යස්ථානයට ලාච්චු රහිත මේසයක් මිලදී ගැනීම | 0.01 | 0.01 | 0.01 | 0.94 |
| | | මාදම්පේ සංස්කෘතික මධ්‍යස්ථානයට බහුකාර්ය මුද්‍රන යන්ත්‍රයක් මිලදී ගැනීම | 0.28 | 0.28 | 0.28 | 1.00 |
| | | නාත්තණ්ඩිය ශ්‍රී සුනන්දාරාම විහාරස්ථානයේ සංඝාවාසය අළුත්වැඩියා | 0.50 | 0.50 | 0.50 | 0.99 |
| | | දන්කොටුව ශ්‍රී බෝධිරුපාරාමය ධර්ම ශාලාව ඉතිරි වැඩ | 0.50 | 0.50 | 0.50 | 0.99 |
| | | මහකුඹුක්කඩවල ශ්‍රී සමිත්තාරාමය ආවාසගෙයි ඉතිරි වැඩ | 0.50 | 0.50 | 0.49 | 0.97 |
| | | මාදම්පෙ ශ්‍රී සමයවර්ධනාරාමය ධර්මශාලාව ඉතිරි වැඩ | 0.50 | 0.50 | 0.49 | 0.98 |
| | | ආරච්චිකට්ටුව ශ්‍රී සුමංගලාරාමය දාන ශාලාවේ ඉතිරි වැඩ | 0.50 | 0.50 | 0.49 | 0.97 |
| | | දන්කොටුව ධර්මප්‍රදීපාරාමය ධර්ම ශාලාව ඉතිරි වැඩ | 1.00 | 1.00 | 0.99 | 0.99 |
| | | දන්කොටුව ශ්‍රී මුණිගුණාරාමය ධර්ම ශාලාව ඉතිරි වැඩ | 1.00 | 1.00 | 0.99 | 0.99 |
| | | දන්කොටුව ජයසුන්දරාරාමය සංඝාවාසයේ ඉතිරි වැඩ | 1.00 | 1.00 | 0.99 | 0.99 |
| | | දන්කොටුව සිරි සුදස්සනාරාමය සංඝාවාසයේ ඉතිරි වැඩ | 1.00 | 1.00 | 0.99 | 0.99 |
| | | සාරධර්ම ප්‍රවර්ධන වැඩසටහන | 0.55 | 0.55 | 0.52 | 0.96 |
| | | පුනරාවර්තන වියදම් | 0.05 | 0.05 | 0.04 | 0.81 |
| 5 | මුදල්, ආර්ථික,ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය (102) | අස්වැසුම වැඩසටහන | 33.78 | 33.78 | 29.61 | 0.88 |
| | | ආබාධිත දීමනාව | 661.89 | 661.89 | 654.81 | 0.99 |
| | | 70 සපිරි වැඩිහිටි දීමනාව | 663.28 | 663.28 | 657.46 | 0.99 |
| | | සියවස් සපිරි වැඩිහිටි දීමනාව | 0.77 | 0.77 | 0.76 | 0.98 |
| | | වකුගඩු දීමනාව | 175.44 | 175.44 | 175.08 | 1.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 6 | ආරක්ෂක අමාත්‍යාංශය (103) | තැනැත්තන් වෙළඳාම පිටු දැකීම පිළිබඳව පුහුණු සැසි | **0.07** | **0.07** | **0.02** | **0.31** |
| | | කල්පිටිය මුසල්පිටිය ග්‍රාම නිලධාරි වසමේ ගංවතුර පාලනය | **3.01** | **3.01** | **0.02** | **0.01** |
| | | නාත්තණ්ඩිය නගරය තුළ ගංවතුර පාලනය සඳහා කුරුළු බෝක්කුව සිට තුම්මෝදර පාළම දක්වා වූ පාරුඇළෙහි ජලය බැස යාමට ඇති බාධා ඉවත් කිරීම | **1.00** | **1.00** | **0.84** | **0.84** |
| | | මුන්දලම පුලිච්චක්කුලම වාන් ඇළ ප්‍රතිසංස්කරණය | **1.65** | **1.65** | **1.57** | **0.95** |
| | | දිට්වා සුළි කුණාටු - හදිසි ආපදා ප්‍රතිචාර | **1.00** | **1.00** | **0.60** | **0.60** |
| | | දිට්ටා සුළි කුණාටුවේ බලපෑමෙන් ඇති වූ ගංවතුඅර/ජල ගැලීම් /සුළි සුළං ඇතුළු ආපදා හේතුවෙන් පීඩාවට පත් පවුල් වල නිවාස පිරිසිදු කිරීම් හා NDRSC/02/04/10 අංක 2025.12.05 දිනැති ලිපිය මඟින් ලබා දී ඇති උපදෙස් පරිදි අදාළ දීමනා ලබා දීමට අදාළ වියදම් | **2,000.04** | **2,000.04** | **1,375.12** | **0.69** |
| | | හදිසි ආපදා හේතුවෙන් හානියට පත් නිවාස සහ දේපළ තක්සේරු කිරීම වෙනුවෙන් නිලධාරීන්ට රු.100 දීමනාව ලබාදීම | **0.11** | **0.11** | **0.11** | **1.00** |
| | | පුත්තලම ආණමඩුව යූබි ජයසූරිය විදයාලයේ සුරක්ෂිත මධ්‍යස්ථානය වැඩි දියුණු කිරීම | **1.36** | **1.36** | **1.34** | **0.98** |
| | | විස්තීර්ණ ආපදා තත්වයෙන් බලපෑමට ලක්වූ පුද්ගලයන්ට අයත් නිවාස වලට බලපෑ ආපදා තත්වය පහව යාමත් සමඟ පදිංචි නිවාස වෙත සුරක්ෂිතව හා සෞඛ්‍යාරක්ෂිතව යොමු කිරීම | **5,055.16** | **5,055.16** | **3,772.33** | **0.75** |
| | | පුනරාවර්ථන වියදම් | **13.06** | **13.06** | **12.87** | **0.99** |
| 7 | අධිකරණ අමාත්‍යාංශය (110) | බහුවාර්ගික,බහුආගමික ජන කණ්ඩායම් අතර සාමය සහජීවනය සහ සංහිඳියාව වැඩි දියණු කිරීමේ ව්‍යාපෘතිය | **0.37** | **0.37** | **0.34** | **0.93** |
| | | ආන්තිකරණයට ලක් වූ ප්‍රජාවගේ ආර්ථික මට්ටම ඉහළ නංවාලීම | **0.33** | **0.33** | **0.32** | **0.96** |
| | | පාරිසරික සුරක්ෂිතාව තුළින් ජන වාර්ගික සහජීවනය ඇති කිරීමේ ව්‍යාපෘතිය | **0.14** | **0.14** | **0.14** | **1.00** |
| | | දිස්ත්‍රික් හා ප්‍රාදේශිය මට්ටමින් භාෂා පුහුණු පාඨමාලා පැවැත්වීම | **0.16** | **0.16** | **0.05** | **0.31** |
| | | රාජ්‍ය භාෂා දිනය හා සමගාමී සතිය මූලික කරගනිමින් දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක කිරීමට නියමිත් වැඩසටහන් | **0.15** | **0.15** | **0.15** | **1.00** |
| | | රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිළිබිඹු කිරීම උදෙසා දිස්ත්‍රික් මට්ටමින් පවත්වනු ලබන වැඩසටහන් | **0.15** | **0.15** | **0.15** | **1.00** |
| | | රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම ප්‍රවර්ධනය කිරීම උදෙසා දිස්ත්‍රික් මට්ටමින් පවත්වනු ලබන වැඩසටහන් | **0.25** | **0.25** | **0.20** | **0.80** |
| | | පුනරාවර්ථන වියදම් | **26.48** | **26.48** | **20.38** | **0.77** |
| 8 | සෞඛ්‍ය අමාත්‍යාංශය (111) | ආර්වේද සංරක්ෂණ සහා සවිබල ගැන්වීම යටතේ වන වෛද්‍ය සායනය | **0.04** | **0.04** | **0.04** | **1.00** |
| | | 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත සම්බන්ධ පුහුණු වැඩසටහන් | **0.06** | **0.06** | **0.06** | **1.00** |
| | | පාරම්පරික ආහාර වට්ටෝරු හා ආහාර සංස්කරණ ක්‍රම හඳුන්වා දීමේ ව්‍යාපාති | **0.02** | **0.02** | **0.02** | **1.00** |
| | | බෝ නොවන රෝග පාලනය සඳහා යෝගා පුහුණු | **0.02** | **0.02** | **0.02** | **1.00** |
| | | වකුගඩු රෝග නිවාරණ වැඩසටහන | **3.75** | **3.75** | **2.87** | **0.77** |
| | | පුනරාවර්ථන වියදම් | **7.19** | **7.19** | **6.90** | **0.96** |
| 9 | විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය (112) | ප්‍රගති සමාලෝචන රැස්වීම් සහ පුහුණු වැඩසටහන් | **0.12** | **0.12** | **0.12** | **0.98** |
| | | ආලංකුඩාව කතෝලික සුසාන භූමිය සිට වෙරළට යන මාර්ගය තාර දමා සංවර්ධනය කිරීම | **4.54** | **4.54** | **0.11** | **0.02** |
| | | කන්දකුලිය කුඩාව මුහුදු වෙරළේ වාහන නැවතුම්පළක් ඉදිකිරීම | **4.53** | **4.53** | **-** | **-** |
| | | ඒත්තාල එරුඹුකුඩල් මුහුදට යන මාර්ගය තාර දමා සංවර්ධනය | **21.83** | **21.83** | **12.66** | **0.58** |
| | | පුනරාවර්ථන වියදම් | **1.07** | **1.07** | **1.00** | **0.93** |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 10 | ප්‍රවාහන,මහාමාර්ග,වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය - (117) | ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන | 28.62 | 28.62 | 22.68 | 0.79 |
| | | ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන | 116.00 | 116.00 | 86.55 | 0.75 |
| 11 | කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය (118) | පරිගණක යන්ත්‍රයක් මිලදී ගැනීම | 0.27 | 0.27 | 0.25 | 0.92 |
| | | මුද්‍රන යන්ත්‍රයක් මිලදී ගැනීම | 0.16 | 0.16 | - | - |
| | | දිස්ත්‍රික් මට්ටමින් පුහුණු වැඩසටහන් පැවැත්වීම | 0.06 | 0.06 | 0.06 | 1.00 |
| | | 2025 දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටු රැස්වීම | 0.06 | 0.06 | 0.06 | 1.00 |
| | | වී අලෙවි මණ්ඩලය සතු ගබඩා අලුත්වැඩියා කිරීම | 0.13 | 0.13 | 0.13 | 1.00 |
| | | ජාතික වන සත්ත්ව සංගණණය | 0.08 | 0.08 | 0.08 | 1.00 |
| | | ආහාර සුරක්ෂිතතාවය හා තාක්ෂණ වැඩසටහන | 4.79 | 4.79 | 3.16 | 0.66 |
| | | වී අලෙවි මණ්ඩලය සත ගබඩා අලුත්වැඩියාව | 0.01 | 0.01 | 0.01 | 1.00 |
| | | අතිරේක ආහාර බෝග ප්‍රවර්ධන වැඩසටහන | 6.07 | 6.07 | 6.01 | 0.99 |
| | | වි අලෙවි මණ්ඩලය සතු ගබඩා අලුත්වැඩියාව | 0.98 | 0.98 | 0.91 | 0.93 |
| | | පුත්තලම ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ හිමිකම් ලියාපදිංචි කිරීමේ අංශය අභ්‍යන්තර බෙදා වෙන් කර සකස් කිරීම සඳහා | 0.33 | 0.33 | 0.22 | 0.67 |
| | | ඉඩම් අත්පත්කර ගැනීම් වෙනුවෙන් වන්දි පොළි | 19.97 | 19.97 | 19.65 | 0.98 |
| | | වාහන අලුත්වැඩියා | 0.25 | 0.25 | 0.25 | 1.00 |
| | | ගොවි සංවිධාන වැඩසටහන් | 0.12 | 0.12 | 0.11 | 0.97 |
| | | පුනරාවර්ථන වියදම් | 32.91 | 32.91 | 31.51 | 0.96 |
| 12 | ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය - මානසික සෞඛ්‍යසතියට සමගාමීව උපදේශන වැඩසටහන් (124) | උපදේශන වැඩසටහන් | 0.10 | 0.10 | 0.10 | 1.00 |
| | | ආබාධ සහිත තැනැත්තන් පිළිබඳව දත්ත පද්ධතිය ස්ථාපනය සම්බන්ධව ලිපි ද්‍රව්‍ය හා මුද්‍රණ කටයුතු | 0.32 | 0.32 | 0.13 | 0.41 |
| | | නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන | 1.91 | 1.91 | 1.45 | 0.76 |
| | | ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන | 37.41 | 37.41 | 30.96 | 0.83 |
| | | ප්‍රජා ශක්ති දිළිඳු බව තුරන් කිරීමේ ජාතික ව්‍යාපාරය | 2.10 | 2.10 | 1.59 | 0.76 |
| | | පුනරාවර්ථන වියදම් | 2.06 | 2.06 | 1.99 | 0.96 |
| 13 | අධ්‍යාපන අමාත්‍යාංශය | පුනරාවර්ථන වියදම් | 0.66 | 0.66 | 0.50 | 0.76 |
| 14 | රාජ්‍ය පරිපාලන පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | සංචාරක බංගලා වැඩිදියුණු කිරීම | 4.52 | 4.52 | 2.83 | 0.63 |
| | | ගෘහ උපකරණ මිලදී ගැනිම | 0.07 | 0.07 | 0.03 | 0.47 |
| | | ගෘහ උපකරණ මිලදී ගැනිම | 0.03 | 0.03 | 0.02 | 0.69 |
| | | ඉ-ග්‍රාම නිලධාරී ව්‍යාපෘතිය යටතේ දත්ත එකතු කිරීමේ කාර්යය | 9.73 | 9.73 | 9.62 | 0.99 |
| | | පුනරාවර්ථන වියදම් | 4.08 | 4.08 | 3.48 | 0.85 |
| 15 | කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය | ජාතික ඵලදායීතා සම්මාන තරඟාවලිය 2025/2026ට අදාළව ලිපිද්‍රව්‍ය ලබාගැනිමට | 0.06 | 0.06 | 0.04 | 0.61 |
| | | දංකොටුව කර්මාන්තපුරයේ අප ජලය ගලායන කාණුව සඳහා පිටවාන සැකසිම | 1.00 | 1.00 | - | - |
| | | ආපදාවෙන් බලපෑමට ලක්වූවන් සමාජ සවිබලගැන්විමේ වැඩසටහන යටතේ කර්මාන්තකරුවන් වෙත දිමනා ගෙවීම | 54.60 | 54.60 | 0.80 | 0.01 |
| | | ගොඩනැගිලි සංවර්ධනය | 1.10 | 1.10 | 0.76 | 0.69 |
| | | දේපල පිරියත උපකරණ | 0.32 | 0.32 | 0.16 | 0.50 |
| | | ලි බඩු සහ කාර්යාල උපකරණ | 0.54 | 0.54 | 0.43 | 0.79 |
| | | කාර්ය මණ්ඩල පුහුණු | 0.20 | 0.20 | 0.13 | 0.63 |
| | | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් පවත්වන වැඩසටහන් | 4.93 | 4.93 | 3.92 | 0.80 |
| | | පුනරාවර්ථන වියදම් | 13.30 | 13.30 | 11.86 | 0.89 |
| 16 | ධීවර ජලජ සම්පත් අමාත්‍යාංශය | දිස්ත්‍රික් ධිවර සම්බන්ධිකරණ කමිටු රැස්වීම | 0.02 | 0.02 | 0.02 | 0.98 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 17 | පරිසර අමාත්‍යාංශය | ජගත් පරිසර දිනයට සමගාමීව වැඩසටහන් | 0.30 | 0.30 | 0.30 | 0.99 |
| | | පාසල් ළමුන් දැනුවත් කරලීමේ වැඩසටහන් | 0.20 | 0.20 | 0.20 | 1.00 |
| | | පුනරාවර්ථන වියදම් | 5.71 | 5.71 | 5.25 | 0.92 |
| 18 | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය | පූර්ව විවාහ උපදේශන වැඩසටහ | 0.10 | 0.10 | - | - |
| | | දිස්ත්‍රික් ළමා සංවර්ධන කමිටු රැස්වීම | 0.06 | 0.06 | 0.05 | 0.94 |
| | | අඩු වයස් ගැබ් ගැනීම වැලැක්වීම පාසල් ළමුන් දැනුවත් කිරීම් වැඩසටහන | 0.09 | 0.09 | 0.09 | 1.00 |
| | | මානසික සෞඛ්‍ය දින වැඩසටහන | 0.05 | 0.05 | 0.05 | 1.00 |
| | | මනො සමාජීය උපදේශන වැඩසටහ | 0.05 | 0.05 | 0.05 | 1.00 |
| | | වනිතා සංවර්ධන නිලධාරීන්ගේ සහ උපදේශන නිලධාරීන්ගේ ප්‍රගති සමාලෝචන රැස්වීම | 0.02 | 0.02 | 0.02 | 0.90 |
| | | ජාත්‍යන්තර කාන්තා දිනය | 0.05 | 0.05 | 0.05 | |
| | | වනිතා නවෝද්‍යා කාන්තා කාර්ය සංවිධාන සක්‍රිය කිරීමේ වැඩසටහන | 0.03 | 0.03 | 0.03 | 1.00 |
| | | වැන්දඹු හා ගෘහමූලික කාන්තා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන | 0.10 | 0.10 | 0.10 | 1.00 |
| | | ධීවර අංශයේ කාන්තා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන | 0.20 | 0.20 | 0.18 | 0.90 |
| | | දිරිය මංපෙත වැඩසටහන | 0.30 | 0.30 | 0.24 | 0.81 |
| | | දිවියට අරුතක් වැඩසටහන | 0.10 | 0.10 | - | - |
| | | කාන්තාවන් සඳහා ආදායම් උත්පාදන පිළිබඳව පුහුණු වැඩසටහන | 0.05 | 0.05 | 0.05 | 1.00 |
| | | කැනපි හට් ලබාදීමේ වැඩසටහන | 0.15 | 0.15 | 0.13 | 0.87 |
| | | වනිතා නවෝද්‍යා කාන්තා කාර්ය සංවිධාන සක්‍රිය කිරීමේ වැඩසටහන | 0.03 | 0.03 | 0.03 | 1.00 |
| | | ව්‍යවසායකත්ව සංවර්ධනය තුළින් කාන්තා සංවර්ධනය යටතේ ජංගම අලෙවි රථයක් ලබාදීමේ වැඩසටහන | 0.09 | 0.09 | 0.09 | 1.00 |
| | | වැන්දඹු ගෘහ මූලික කාන්තා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන | 0.10 | 0.10 | - | - |
| | | නියාමනය නොකල ක්ෂුද්‍ර ණය යෝජනා ක්‍රම වලින් පීඩාවට පත් කාන්තාවන්ට සහන සැලසීම | 0.30 | 0.30 | 0.29 | 1.00 |
| | | ගැබිනි මව්වරුන් සඳහා පෝෂණ දීමනාව | 390.76 | 390.76 | 332.18 | 0.85 |
| | | පෙර පාසල් දරුවන් සඳහා උදෑසන ආහාර වේල | 104.67 | 104.67 | 87.93 | 0.84 |
| | | පෙර පාසල් ගුරු දීමනාව | 37.43 | 37.43 | 37.01 | 0.99 |
| | | මුල් ළමවිය සංවර්ධන නිලධාරී ප්‍රගති සමාලෝචන රැස්වීම | 0.02 | 0.02 | 0.02 | 0.87 |
| | | ලෝක ළමා දින වැඩසටහන | 0.06 | 0.06 | 0.06 | 1.00 |
| | | මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය වැඩසටහන් | 0.51 | 0.51 | 0.51 | 1.00 |
| | | පුනරාවර්ථන වියදම් | 1.47 | 1.47 | 1.34 | 0.91 |
| 19 | ඩිජිටල් ආර්ථක අමාත්‍යාංශය (186) | පරිපාලන යාන්ත්‍රනයේ ඩිජිටල් හැකියාව සංවර්ධනය කිරිම | 17.00 | 17.00 | 9.55 | 0.56 |
| 20 | මහජන ආරක්ෂක අමාත්‍යාංශය (189) | පුනරාවර්ථන වියදම් | 0.24 | 0.24 | 0.18 | 0.75 |
| 21 | තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය (194) | ස්ව වායු ව්‍යායාම වැඩසටහන | 0.53 | 0.53 | 0.43 | 0.81 |
| 22 | විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය (196) | මූලධන වියදම් යන්ත්‍රොපකරණ මිලදී ගැනිම | 0.18 | 0.18 | 0.17 | 1.00 |
| | | තාක්ෂණ පැවරුම් වැඩසටහන් | 0.13 | 0.13 | 0.12 | 0.89 |
| | | පුනරාවර්ථන වියදම් | 2.83 | 2.83 | 2.38 | 0.84 |
| 23 | බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව (201) | ඌණ සංවර්ධිත දහම් පාසල් සංවර්ධනය කිරීම | 1.80 | 1.80 | 1.78 | 0.99 |
| | | දහම් පාසල් ගුරු පුහුණු වැඩසටහන | 0.45 | 0.45 | 0.42 | 0.92 |
| | | පුනරාවර්ථන වියදම් | 19.52 | 19.52 | 17.36 | 0.89 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 24 | මුස්ලිම් ආගමික කටයුතු දෙපාර්තමේන්තුව | මුස්ලිම් ආගමික ස්ථානවලට පහසුකම් සැපයීම හා සංවර්ධනය | 1.23 | 1.23 | 1.21 | 0.99 |
| | | පුනරාවර්තන වියදම් | 0.01 | 0.01 | 0.01 | 1.00 |
| 25 | ක්‍රිස්තියානි අගමික කටයුතු දෙපාර්තමේන්තුව | බොරලැස්ස ශා.ආනා දේවස්ථාන දහම් පාසල් ගොඩනැගිල්ල සංවර්ධනය | 1.00 | 1.00 | 0.90 | 0.90 |
| | | පුනරාවර්තන වියදම් | 0.36 | 0.36 | 0.35 | 0.99 |
| 26 | සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | අගහිඟ කලාකරු ආධාර ලබාදීම,කලාකරු සුවද දූම් වැඩසටහන,පෙරහැර ආධාර ලබාදීම | 0.92 | 0.92 | 0.82 | 0.90 |
| | | දොළොස්මහේ පහන වැඩසටහන | 0.43 | 0.43 | 0.25 | 0.58 |
| | | ළමා කලා උත්සවය | 0.06 | 0.06 | 0.05 | 0.94 |
| | | කලාභූෂණ සම්මාන උළෙල | 0.01 | 0.01 | 0.01 | 1.00 |
| | | දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන රැස්වීම | 0.02 | 0.01 | 0.02 | 1.68 |
| | | කලායතන ආධාර | 0.20 | 0.20 | 0.17 | 0.85 |
| | | සාහිත්‍ය උත්සවය | 0.61 | 0.61 | 0.49 | 0.80 |
| | | පුනරාවර්තන වියදම් | 0.75 | 0.75 | 0.51 | 0.68 |
| 27 | රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව (210) | පුනරාවර්තන වියදම් | 0.07 | 0.07 | 0.05 | 0.78 |
| 28 | සමාජ සේවා දෙපාර්තමේන්තුව (216) | ප්‍රජා මත් නිවාරණ වැඩසටහන | 0.03 | 0.03 | 0.03 | 1.00 |
| | | ප්‍රජා මූලික පුනරුත්ථාපන ජාතික වැඩසටහන අදාළව ප්‍රගති සමාලෝචන රැස්වීම දිස්ත්‍රික් ඒකාබද්ධ ප්‍රගති සමාලෝචන රැස්වීම | 0.08 | 0.08 | 0.08 | 1.00 |
| | | ස්වයං රැකියාවල නියුතු ආබාධ සහිත පුද්ගලයන් සඳහා ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහන | 0.01 | 0.01 | 0.01 | 1.00 |
| | | ප්‍රජා මූලිකා පුනරුත්ථාපන වැඩසටහන යටතේ සෘජු ආධාර | 0.02 | 0.02 | 0.02 | 1.00 |
| | | ප්‍රජා මූලික පුනරුත්ථාපන වැඩසටහනට අදාළව සංවර්ධන ව්‍යාපෘති | 0.46 | 0.46 | 0.45 | 0.99 |
| | | ආබාධ සහිත පුද්ගලයින් සඳහා ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහ | 0.03 | 0.03 | 0.01 | 0.33 |
| | | ආබාධ සහිත වූවන්ගේ ජාතික වෙළඳ වෘත්තීය නිපුණතා ප්‍රදර්ශනයේ ප්‍රවාහන සහ ආහාර දීමනා | 0.06 | 0.06 | 0.06 | 1.00 |
| | | ආබාධ සහිත වූවන්ගේ ජාතික මළල ක්‍රීඩා තරඟාවලිය හා සිත් රූ සංස්කෘතික ප්‍රසංගය | 0.66 | 0.66 | 0.66 | 1.00 |
| | | මාදම්පේ වෘත්තිය පුහුණු ආයතනයේ අළුත්වැඩියා | 1.13 | 1.13 | 1.03 | 0.91 |
| | | පුනරාවර්තන වියදම් | 24.29 | 24.29 | 22.89 | 0.94 |
| 29 | පරිවාස හා ළමා ආරක්ෂක දෙපාර්තමේන්තුව (217) | ප්‍රාදේශීය ළමා සභාව/දිස්ත්‍රික් ළමා සභා හා ලෝක ළමා දින වැඩසටහන | 1.38 | 1.38 | 1.22 | 0.88 |
| | | වෛද්‍ය පෝෂණාධාර | 0.04 | 0.04 | 0.03 | 0.86 |
| | | කැපකරු දෙගුරු | 0.33 | 0.33 | 0.33 | 1.00 |
| | | නිවුන් දරු ආධාර | 0.02 | 0.02 | 0.02 | 1.00 |
| | | පුනරාවර්තන වියදම් | 0.46 | 0.46 | 0.32 | 0.69 |
| 30 | ක්‍රීඩා හා සංවර්ධන දෙපාර්තමේන්තුව (219) | පු/කරතිව් මුස්ලිම් විදුහලේ ක්‍රීඩාංගනය සංවර්ධනය | 10.00 | 10.00 | 6.72 | 0.67 |
| | | නාත්තණ්ඩිය ධම්මිස්සර ජාතික පාසලේ ඉදිවෙමින් පවතින ගෘහස්ථ ක්‍රීඩාගාරයේ ක්‍රීඩා පිටිය ප්‍රදේශයට විදුලිය ලබා ගැනීම | 5.00 | 5.00 | 4.86 | 0.97 |
| | | පුනරාවර්තන වියදම් | 0.08 | 0.08 | 0.01 | 0.12 |
| 31 | පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව (227) | පුනරාවර්තන වියදම් | 26.77 | 26.77 | 26.09 | 0.97 |
| 32 | ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව (237) | විමධ්‍යගත අයවැය වැඩසටහන | 92.00 | 92.00 | 83.19 | 0.90 |
| 33 | ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තු (248) | පුනරාවර්තන වියදම් | 0.92 | 0.92 | 0.74 | 0.81 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 34 | ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (252) | කාර්යාල උපකරණ මිලදී ගැනිම | 0.35 | 0.35 | 0.23 | 0.67 |
| | | ජන හා නිවාස සංගණනය | 45.74 | 45.74 | 43.82 | 0.96 |
| | | පුනරාවර්ථන වියදම් | 6.80 | 6.80 | 5.42 | 0.80 |
| 35 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව (253) | ගෘහ භාණ්ඩ කාර්යාලිය උපකරණ මිලදී ගැනිම | 0.01 | 0.01 | 0.01 | 1.00 |
| | | සිවිල් විශ්‍රාම වැටුප් | 16.90 | 16.90 | 15.77 | 0.93 |
| | | වැන්දඹු විශ්‍රාම වැටුප් | 7.92 | 7.92 | 6.63 | 0.84 |
| | | පුනරාවර්ථන වියදම් | 1.29 | 1.29 | 0.95 | 0.73 |
| 36 | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව (254) | හලාවත ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය අළුත්වැඩියාව | 8.39 | 8.39 | 0.19 | 0.02 |
| | | පුනරාවර්ථන වියදම් | 10.03 | 10.03 | 9.82 | 0.98 |
| 37 | වන ජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව (284) | වන අලි ඉවත් කිරීමේ මෙහෙයුම | 9.16 | 9.16 | 6.99 | 0.76 |
| 38 | ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව(286) | ඉඩම් ගැටළු පිළිබඳ ජංගම සේවා වැඩසටහන | 0.04 | 0.04 | 0.02 | 0.57 |
| | | නෙරපීමේ නියෝග ක්‍රියාත්මක කිරීම | 0.11 | 0.11 | - | - |
| | | පුනරාවර්ථන වියදම් | 0.78 | 0.78 | 0.78 | 0.99 |
| 39 | ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව (290) | හලාවත ධීවර උප කාර්යාලයේ වහලය අළුත්වැඩියාව | 0.24 | 0.24 | - | - |
| | | ජනසවිපුර මොහොත්තුවාරම,ආනවාසල,උච්චමුනේ ඇති ඇළ මාර්ගයයන් ගැඹුරු කිරිමට යොජිත ව්‍යාපෘති | 2.91 | 2.91 | 0.37 | 0.13 |
| 40 | පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව(303 | පුනරාවර්ථන වියදම් | 10.37 | 10.37 | 9.80 | 0.94 |
| 41 | මෝටර් රථ දෙපාර්තමේන්තුව (307) | පුනරාවර්ථන වියදම් | 1.28 | 1.28 | 1.01 | 0.79 |
| 42 | ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව (326) | පුනරාවර්ථන වියදම් | 0.70 | 0.70 | 0.49 | 0.70 |
| 43 | ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව (327) | පුත්තලම දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් කාර්යාල ගොඩනැගිල්ල අළුත්වැඩියා | 2.50 | 2.50 | 2.50 | 1.00 |
| | | කාර්යාලයිය උපකරණ මිලදී ගැනීම | 0.04 | 0.04 | 0.04 | 1.00 |
| | | සංවර්ධන වැඩසටහන් | 2.52 | 2.52 | 2.51 | 0.99 |
| | | පුනරාවර්ථන වියදම් | 0.52 | 0.52 | 0.46 | 0.88 |
| 44 | මිනිස්බල සහ රැකීරක්ෂා දෙපාර්තමේන්තුව (328) | දිස්ත්‍රික් / ප්‍රාදේශිය රැකියාපොළ වැඩසටහන සඳහා | 0.24 | 0.24 | 0.36 | 1.50 |
| | | Smart Youth වැඩසටහන සඳහා ප්‍රතිපාදන | 0.09 | 0.09 | 0.09 | 1.00 |
| | | අවිධිමත් අංශයේ ව්‍යාපාර සංවර්ධන වැඩසටහන | 0.03 | 0.03 | 0.03 | 1.00 |
| | | ඩිජිටල් ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන | 0.32 | 0.32 | 0.32 | 1.00 |
| | | විධිමත් අංශයේ සේවා නියුක්ත පිරිස් කේන්ද්‍රගත කරන වැඩසටහන සඳහා ප්‍රතිපාදාන (සංචාරක බොට්ටු රයිඩර්වරුන්) | 0.15 | 0.15 | 0.15 | 1.00 |
| | | සාත්තු සේවයේ අදාළ සමීක්ෂණයේ දත්ත ඇතුළත් කිරීම හා විශ්ලේෂණය | 0.00 | 0.00 | 0.00 | 1.00 |
| | | පුනරාවර්ථන වියදම් | 0.74 | 0.74 | 0.68 | 0.92 |
| | | | 9,965.58 | 9,965.58 | 7,773.91 | 0.78 |

## 3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

| වත්කම් කේතය | කේත විස්තරය | 31.12.2025 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව ශේෂය | 31.12.2025 දිනට මූල්‍ය තත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේදී ගිණුම්කරණය ට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| **9151** | ගොඩනැගිලි හා ව්‍යුහයන් | 1,506,666,576 | 1,506,666,576 | තක්සේරු කිරීමට යොමුකර ඇත. | 100% |
| **9152** | යන්ත්‍රෝපකරණ | 536,661,313 | 536,661,313 | ............ | 100% |
| **9153** | ඉඩම් | 1,058,162,200.00 | 1,058,162,200.00 | ............ | 100% |
| **9154** | අස්පෘශ්‍ය වත්කම් | - | - | - | |
| **9155** | ජීව විද්‍යාත්මක වත්කම් | - | - | - | |
| **9160** | කෙරීගෙන යන වැඩ | - | - | - | |
| **9180** | බදු දෙන ලද වත්කම් | - | - | - | |

## 3.9 විගණකාධිපතිවරයාගේ වාර්තා

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. NWCG/PT/A/DS.PUT/02/2025/14

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2026 මැයි 27 දින

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
ගිණුම් අංශය
01 JUN 2026
පුත්තලම

ගණන්දීමේ නිලධාරී
පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**ශීර්ෂ - 273 පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

යථෝක්ත වාර්තාව සහ පරීක්ෂා කරන ලද මූල්‍ය ප්‍රකාශන මේ සමඟ ඉදිරිපත් කරමි.

එම්.ජී. මදරසිංහ
නියෝජ්‍ය විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

එම්.ජී.මදරසිංහ
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත :- අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය, කොළඹ 01

A/12
12/01

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. NWCG/PT/A/DS.PUT/02/2025/14

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2026 මැයි 27 දින

ගණන්දීමේ නිලධාරි
පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**ශීර්ෂ - 273 පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂ - 273 පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2025 අංක 19 දරන ජාතික විගණන සංශෝධිත පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේ දී ඉදිරිපත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම මෙම වාර්තාව් මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි

ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තිය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය නොවන වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක SA/GFS/01/01/08 – Volume හා 2020 දෙසැම්බර් 23 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා පල්ලම, නාත්තන්ඩිය, කරුවලගස්වැව, වනාතවිල්ලුව, කල්පිටිය, ආරච්චිකට්ටුව, මහකුඹුක්කඩවල සහ මාදම්පේ යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල පිහිටි භූමියෙහි හිමිකම තහවුරු කරගෙන තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) හලාවත ප්‍රාදේශීය ලේකම් ඇතුළු නිලධාරීන්ගේ පරිහරණයට ඇති උප ලේඛනගත හා උපලේඛනගත නොවන රජයේ නිවාසවල හිමිකම තහවුරු කරගෙන තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) හලාවත, පුත්තලම, මුන්දලම, වනාතවිල්ලුව, කල්පිටිය, ආරච්චිකට්ටුව, ආණමඩුව සහ මාදම්පේ යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ග්‍රාම නිලධාරී කාර්යාල 147 ක ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) නවගත්තේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වට්ටෝරු ලේඛනය අනුව රු.2,168,000 ක් වටිනා ලැප්ටොප් යන්ත්‍ර 24 ක් සිගාස් වැඩසටහනේ රු.789,000 ක් ලෙස ද සිගාස් වැඩසටහනේ පැවති රු.908,400 ක් වටිනා පරිගණක 44 ක් වට්ටෝරු ලේඛනයේ 39 ක් ලෙස ද, භෞතිකව පැවති ප්‍රින්ටර් 18 ක් සිගාස් පරිගණක වැඩසටහනේ ප්‍රින්ටර් 17 ක් ලෙසද දක්වා තිබුණි. එම වත්කම් ලේඛන හා සිගාස් වැඩසටහන අතර පැවති විචලතා හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) කල්පිටිය සහ ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අයිතම 33 කට අදාල වත්කම්වල වටිනාකම් සිගාස් වැඩසටහනෙහි දක්වා නොතිබුණි.

(ඊ) ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ එකතු වටිනාකම රු.මිලියන 17.77 ක් වූ රජයේ ඉඩම් හා ගොඩනැඟිලි 09 ක් ගිණුම්ගත කර තිබුණ ද, ඒවායේ පාලනය හා කළමනාකරණය රජයේ වෙනත් අස්ථිත්වයන් විසින් සිදුකරමින් පැවතුණි.

(උ) ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකය මඟින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 09 කට ලබාදී තිබුණු වත්කම් විෂයයන් 38 ක් හා ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය මඟින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 කට ලබාදී තිබුණු ලොරි බවුසර් 06 ක වටිනාකම හඳුනාගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

1.6.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

ACA – 06 ආකෘතිය අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 හි මූල්‍ය නොවන වත්කම් වටිනාකම රු.මිලියන 3101.49 ක් බව දක්වා තිබුණ ද, එම වත්කම්වල අයිතිය හඳුනා ගැනීමට අදාල ලේඛන හා භෞතික පැවැත්ම තහවුරු කර ගැනීමට තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා අදාල වත්කම් වටිනාකම විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කල නොහැකි විය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| 1.6.1 (අ) | තක්සේරු කර ගිණුම්ගත කළයුතු වීම | 1.6.1 (අ)(ඇ) |
| 3.2 (ආ) | නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කලයුතු වීම | 3.1 (ඇ) |
| 3.4 (ආ)(i) | චක්‍රලේඛ ප්‍රකාරව ස්ථානමාරු ක්‍රියාත්මක කලයුතු වීම | 3.4 (ඇ) |
| 4.1.2 (අ)(ආ) | අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට ක්‍රියාකළ යුතු වීම | 4.1.1 (අ) |
| 4.1.3 | ව්‍යාපෘති නිම කිරීමට කටයුතු කළයුතු වීම | 4.1.2 (ඉ) |
| 4.2 (ඊ)(උ)(ඌ)(එ) | විද්‍යුත් ප්‍රසම්පාදන (EGP) අනුගමනය කළයුතු වීම | 4.2 (ඇ)(ඇ) |
| 4.7 (ආ) | රජයට අයවිය යුතු මුදල් නොපමාව අයකළයුතු වීම | 4.7 (ආ) |

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 50 අනුව ඇස්තමේන්තු හැකිතාක් සම්පූර්ණ ලෙස හා නිවැරදිව සකස් කළයුතු වීම හා යම් වැය විෂයට අදාලව වර්ෂයේ වෙන්කර ඇති ප්‍රතිපාදන ඉතිරිවන බවට හැගීයන විට මු.රෙ.66 ප්‍රකාරව කටයුතු කළයුතු වුවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වැය විෂයයන් 27 කට අදාලව රු.50,629,722 ක ප්‍රතිපාදන ඉතිරිව පැවති අතර එය මුළු ප්‍රතිපාදන මුදලේ ප්‍රතිශතයක් ලෙස සියයට 11 සිට සියයට 77 ක පරාසයක් ගෙන තිබුණි.

(ආ) අංක 273 – 1 – 1 – 0 – 2002 දරන යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ වැය විෂයය සඳහා වෙන් කර තිබුණු රු.500,000 ක සම්පූර්ණ ප්‍රතිපාදන මුදලම වැය නොකර ඉතිරිවී තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 50 (II) හා (III) ප්‍රකාරව හැකිතාක් දුරට නිවැරදිව වියදම් ඇස්තමේන්තු පිළියෙල නොකිරීම නිසා මූලික හා සංශෝධිත ඇස්තමේන්තු අතර අවස්ථා 11 ක දී රු.15,750,000 ක විචලතාවක් වූ අතර එකී විචලතාවන් සම්බන්ධව කරුණු පැහැදිලි කිරීම් ද විගණනයේ දී පිළිගත නොහැකි විය.

(ඇ) රාජ්‍ය පරිපාලන අමාත්‍යංශ ලේකම්ගේ 2008 ජූනි 26 දිනැති හා අංක 13/2008 දරන චක්‍රලේඛයේ 04 උප ඡේදය ප්‍රකාරව ලබා දී ඇති ඉන්ධන සීමාව තුළ ඉන්ධන ප්‍රමාණය කළමනාකරණය කළ යුතු බවත් රාජකාරි ස්ථානයෙන් බැහැර යන විට කණ්ඩායම් ප්‍රවාහන කටයුතු සඳහා අතිරේක ඉන්ධන ප්‍රතිපාදන ලබා දිය යුතු වුවත් පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16

සඳහා සමාලෝචිත වර්ෂයේ රු.2,093,365 ක ඉන්ධන ලීටර් 7,465 ක් කණ්ඩායම් ප්‍රවාහනය හැර සාමාන්‍ය රාජකාරි සඳහා ලබා දී තිබුණි.

3.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

2025 නොවැම්බර් 03 දිනැති අංක 01/2025 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 3.9 හා 4.1 විධිවිධාන ප්‍රකාරව 2025 දෙසැම්බර් 31 දිනට වර්ෂයේ මුදල් පොත පියවිය හැකි පරිදි ගණන්දීමේ නිලධාරී විසින් ආයතනික මෙහෙයුම් කටයුතු මනා සැලසුමකින් යුතුව සකස් කර ක්‍රියාත්මක කළයුතු වුවත්, ගිණුම් ප්‍රකාශයේ ඇමුණුම III යටතේ අවස්ථා 13 ක දී රු.1,589,776 ක් බැදීම් හා බැරකම් ඇතිකරගෙන තිබුණි.

3.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.7 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබාදී නොතිබුණි.

3.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂාවේ දී අනාවරණය වූ නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 1645 (අ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ නවගත්තේගම, මහවැව, පල්ලම, කරුවලගස්වැව, පුත්තලම, මුන්දලම, වනාතවිල්ලුව, කල්පිටිය, ආරච්චිකට්ටුව, මහකුඹුක්කඩවල, දංකොටුව සහ මාදම්පේ යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වාහන 52 කට අදාලව ලොග් සටහන් පොත් විධිමත් අධීක්ෂණයක් යටතේ යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12 ක කාල සීමාවකින් අනතුරුව හෝ කිලෝමීටර් 25000 ක් ධාවනය කිරීමෙන් පසු හෝ එන්ජින් අළුත්වැඩියාවකින් පසු යන කාරණාවලින් මුලින් යෙදෙන අවස්ථාවට පසු නැවත ඉන්ධන පරීක්ෂාවක් සිදු කළයුතු වුවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා නවගත්තේගම සහ ආරච්චිකට්ටුව යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වල වාහන 11 ක සමාලෝචිත වර්ෂයේ ඉන්ධන පරීක්ෂාව සිදුකර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2022 දෙසැම්බර් 14 දිනැති අංක 2310/29 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයේ කාර්ය පටිපාටි රීති 01 වැනි කාණ්ඩයේ (xviii) පරිච්ඡේදයේ 251 වගන්තිය | අනුමත ස්ථානමාරු පටිපාටි අනුව උපරිම සේවා කාලය වසර 05 ක් එකම සේවා ස්ථානයේ සේවය කර ඇති දීප ව්‍යාප්ත සේවාවල නිලධාරීන් හා එසේ නොවන අනෙකුත් නිලධාරීන් රාජ්‍ය සේවයේ පොදු ප්‍රතිපත්තිය අනුව කාලීනව ස්ථාන මාරු කළයුතු වුවත්, පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 ක නිලධාරීන් 171 ක් සඳහා එකී විධිවිධාන ක්‍රියාත්මක කර නොතිබුණු අතර ඔවුන්ගේ සේවා කාලය එකම ස්ථානයක වසර 06 ත් 25 ත් අතර විය. |

3.5 තැන්පතු

මුදල් රෙගුලාසි 571(3) ප්‍රකාරව පොදු තැන්පත් ගිණුමක අවිනිශ්චිතව තබාගෙන ඇති මුදල් ඉකුත් වූ තැන්පතු වශයෙන් සළකනු ලැබීම සඳහා ඉඩ නොතබා අවස්ථාවෝචිත පරිදි අදාල ගිණුමට හෝ රජයේ ආදායමට හෝ බැර කිරීම, හැකි ඉක්මණින් ආපසු ගෙවීම හෝ සිදුකළ යුතු වුවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඇතුළුව මහවැව, මුන්දලම හා මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල රු.12,085,619 ක තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2019 වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් නවගත්තේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විදුලි පද්ධතිය රු.මිලියන 1.898 ක් වැය කර ඉදි කලද එය නිසි පරිදි ඉටු නොකිරීමෙන් නිරන්තර විදුලි බිඳ වැටීම් ද, රු. මිලියන 1.323 ක් වැය කර ඉදිකල සනීපාරක්ෂක පද්ධතියේ උපකරණ නිතර අකර්මන්‍ය වී දුර්ගන්ධය වහනය වෙමින්ද, රු. මිලියන 0.918 ක් වැය කර ඉදිකල ඉදිරි වැරන්ඩා වහලය වර්ෂා කාලවල තෙමෙමින් හා රු.මිලියන 0.123 ක් වැය කර ඉදිකල ඉදිරි වැරන්ඩා බිමේ ටයිල් පුපුරා ගැලවෙමින් ද පැවතුණු අතර ඒ සඳහා ප්‍රවර්ථන වර්ෂයේ ද කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) හලාවත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් රු. මිලියන 5.5 ක් වැයකර ඉදිකර තිබුණු තිසෝගම මහයාය කෘෂි මාර්ගයේ එක් ස්ථානයක් දැනටමත් කැඩී ගොස් තිබුණු අතර බත්කඩේ වත්ත මාර්ගය හා වීරපඩියාන, සිප්පිතලාන, මැල්ලකැලේ මාර්ගයේ බොරලු නිසි පරිදි ජලය යොදා තලා නොතිබීමෙන් ජලයට සේදී ගොස් තිබුණි.

(ඇ) මුන්දලම නව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඉදි කිරීමේදී ඒ අසලින් ස්ථානගත කර තිබුණු අධිබලැති විදුලි රැහැන් පද්ධතිය සමාලෝචිත වර්ෂයේ දී ද ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණු බැවින් ගොඩනැගිල්ලේ ඉදිරි සංවර්ධන කටයුතු අතර මග නවතා තිබුණු අතර ගොඩනැගිල්ලේ රාජකාරී කරන නිලධාරීන්ගේ හා සේවාලාභී මහජනතාවගේ ජීවිත ද අවදානමට ලක් වී තිබුණි.

(ඇ) මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් 2025 ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ ව්‍යාපෘති 06 ක් සඳහා රු. මිලියන 9.718 ක් වියදම් කර මාර්ග අලුත්වැඩියා කර තිබුණු අතර ඉන් රු.360,722 ක් බොරළු දැමීමට වැය කළ ද, ඒවා නිසි පරිදි ජලය යොදා තැලීමට කටයුතු නොකිරීම නිසා වැසි දිනට සෝදා යාමට ලක්ව තිබුණි.

4.1.2 ව්‍යාපෘති නිම නොකර අතහැර දැමීම
පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2024 විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ ව්‍යාපෘති 06 ක් සඳහා රු.2,150,000 ක ප්‍රතිපාදන මහවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලැබී තිබුණ ද, ඉන් ව්‍යාපෘති 05 ක රු.1,650,000 ක සම්පූර්ණ ප්‍රතිපාදන මුදලමද, තවත් ව්‍යාපෘතියක ප්‍රතිපාදන සියයට 83 ක් එනම් රු.413,818 ක් උපයෝජනය කර නොතිබුණි.

(ආ) හලාවත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර වැසිකිළි පද්ධතිය ඉදි කිරීම හා නරියාගම වෙරළබඩ නිල නිවස ඉදි කිරීම සඳහා රු. මිලියන 06 ක් ලැබී තිබුණු අතර ඉන් රු. මිලියන 4.63 ක් එනම් සියයට 77 ක් උපයෝජනය කර නොතිබුණි.

(ඇ) 2024 වර්ෂයේ දී පුත්තලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංවර්ධන ව්‍යාපෘති 172 ක් සඳහා ප්‍රතිපාදන මුදල් ලැබී තිබුණු අතර ඉන් ව්‍යාපෘති 40 ක එකතු වටිනාකම රු. මිලියන 60.36 ක් උපයෝජනය කර නොතිබුණි.

(ඈ) වනාතවිල්ලුව හා මහකුඹුක්කඩවල ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ව්‍යාපෘති 09 ක් ඉටුකිරීම සඳහා ලද රු.මිලියන 2.44 ක් සමාලෝචිත වර්ෂය තුළ උපයෝජනය කර නොතිබුණි.

(ඉ) මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් 2019 ගම්පෙරලිය වැඩසටහන යටතේ රු.මිලියන 85,58 ක් වැයකල ජල ව්‍යාපෘති 09 ක් හා 2021 ගම සමඟ පිළිසඳරක් වැඩසටහන යටතේ රු.මිලියන 3,36 ක් වැයකර ඉදිකර තිබුණු රජයේ ගොඩනැගිලි 06 ක් සඳහා මූලා පහසුකම් නොලැබීම මත සම්පූර්ණ කිරීමෙන් තොරව අතහැර දමා තිබුණි.

4.1.3 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 06 ක රු.මිලියන 40.4 ක ව්‍යාපෘති 39 ක් නිම කිරීමේ දී දින 04 සිට 107 දක්වා ප්‍රමාදයක් සිදුව තිබුණි.

4.1.4 වාර්ෂික කාර්ය සාධන වාර්තාව

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු කෙටුම්පත් වාර්ෂික කාර්යසාධන වාර්තාවේ 6.1 හා 6.3 ඡේද යටතේ 2024 වර්ෂයේ තොරතුරුම ඉදිරිපත් කර තිබුණි.

4.2 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) භාණ්ඩාගාර ලේකම්ගේ 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඉදිරි වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම දෙසැම්බර් 10 දිනට ප්‍රථම පිළියෙල කර ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අනුමැතිය යටතේ විගණකාධිපති, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට හා ප්‍රසම්පාදන කොමිසම වෙත ඉදිරිපත් කළයුතු වුවත්, එසේ නියමිත දිනට ඉදිරිපත් කර නොතිබුණු අතර ගණන්දීමේ නිලධාරී පමණක් දින රහිතව අත්සන් කර තිබුණි.

(ආ) පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2025 ප්‍රසම්පාදන කටයුතු සඳහා වැය විෂයන් 15 කට රු.මිලියන 202.85 ක් ඇස්තමේන්තු කර තිබුණු අතර ඉන් වැය විෂයන් 04 ක් සඳහා රු.මිලියන 114.25 කට පමණක් ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර තිබුණි. එහෙත් සත්‍ය වියදම රු.මිලියන 159.53 ක් වන බැවින් , ඒ අනුව රු.මිලියන 88.59 ක් සඳහා ප්‍රසම්පාදන සැලසුමක් පිළියෙල කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2, 4.2.3 හා 2024 ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද භාණ්ඩ, වැඩ හා උපදේශක නොවන සේවා සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.1.5 වගන්තිය ප්‍රකාරව ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භයේ සිට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම දක්වා එක් එක් ප්‍රසම්පාදන කාර්යයන් කාලානුක්‍රමිකව විස්තර කෙරෙන පරිදි ප්‍රසම්පාදන කාලසටහනක් (PTS) පිළියෙල කර නිරන්තර යාවත්කාලීන කිරීම ප්‍රසම්පාදන අස්ථිත්වයේ වගකීම වුවද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය එපරිද්දෙන් කටයුතු කර නොතිබුණි.

(ඈ) 2019 දෙසැම්බර් 17 දිනැති අංක 08/2019 දරන රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛයේ 2.3 ඡේදය ප්‍රකාරව දැනට සැපයුම් ලබා ගන්නා විකුණුම් කරුවන්හට www.promise.lk වෙබ් අඩවියේ ලියාපදිංචි වන ලෙස ඉල්ලීම් කර ලංසු කැඳවා ප්‍රසම්පාදන කටයුතු සිදුකරන ලෙස හා චක්‍රලේඛයේ 2.4 හා 2.5 ඡේදය ප්‍රකාරව සෑම වසරකම දෙසැම්බර් 31 දිනට පෙර ආයතනයේ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම (Annual Procurement Plan) වෙබ් අඩවියට උඩුගත (Upload) කළ යුතු ලෙස දක්වා තිබුණ ද දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඊට අදාළව කටයුතු කර නොතිබුණි.

4.3 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 128 (ඉ) ප්‍රකාරව ගණන්දීමේ නිලධාරියෙකු තම භාරයේ ඇති වත්කම් සුරක්ෂිතව තබාගැනීම හා සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් විධි විධාන යෙදිය යුතු වුවත්, නවගත්තේගම, හලාවත, පල්ලම, ආණමඩුව, මහවැව හා මාදම්පේ යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල ඇති උපලේඛනගත රජයේ නිවාසවල සුරක්ෂිත බව හා සංරක්ෂණය සඳහා කටයුතු කර නොතිබුණි.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රු.මිලියන 3.458 ක වියදමකින් ස්ථාපිත කර තිබුණ කැමරා 70 කින් යුතු CCTV පද්ධති 02 සුදුසු තාක්ෂණික ක්‍රමවේදයන් හා කාලීනව කළයුතු යාවත්කාලීන කිරීම් සිදු නොකිරීමෙන් අක්‍රිය තත්ත්වයට පත්ව ඇති අතර මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ එක් කැමරාවක් අස්ථානගතවී තිබුණි.

(ඇ) නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නැගෙනහිර විරහේන ග්‍රාම නිලධාරී වසමේ පිහිටි අක්කර 09 රූඩ් 02 පර්චස් 10 කින් යුත් නාගරික ඉඩම වසර 05 ක කාලසීමාවක සිට කුමන හෝ සංවර්ධන කටයුත්තකට නොගැනීම හේතුවෙන් නිෂ්කාර්යව පවතින අතර 2024 හා 2025 වර්ෂ සඳහා වරිපනම් ලෙස රු.116,112 ක් පළාත් පාලන ආයතනයට රජයේ මුදලින් ගෙවා තිබුණි.

(ඈ) වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල 2019 වර්ෂයේ සිට ගිලා බැස්මට ලක්ව තිබුණ ද, මේ පිළිබඳව පැහැදිලි නිශ්චිත සොයා බැලීමකින් තොරව විවිධ අවස්ථා වලදී රජයේ මුදල් වැය කර අලුත්වැඩියාවන් සිදු කර තිබුණු අතර, නිලධාරීන්ගේ හා මහජනයාගේ ජීවිත දැඩි අවදානමකට ලක්ව තිබුණි.

4.4 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගණකාධිකාරී තනතුරේ වැඩ බැලීම සඳහා පල්ලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගණකාධිකාරී පත්කර තිබුණු අතර වාහන සඳහා හිමිකම නොතිබිය දී හා ඒ සඳහා ප්‍රමාණවත් අනුමැතියක් ලබාගැනීමකින් තොරව රජයේ වාහනයක් මඟින් ගමන් පහසුකම් සලසාගෙන ඒ සඳහා කිලෝමීටර් 2225 සඳහා ඉන්ධන ලෙස රු.47,410 ක් වැය කිරීම වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංචිත කැබ් රථයේ ධාවන සටහන් හා වාහනයේ මයිලෝ මීටරයේ සඳහන් දුර ප්‍රමාණය අතර විශාල වෙනස්කම් තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ඊට වගකිව යුතු පාර්ශව හඳුනාගෙන නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට හා මීටරයේ පැවති වෙනස නිවැරදි කර ධාවනයට සුදුසු වනසේ සකස් කිරීමට කටයුතු කර නොතිබුණි.

NAOSL ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

4.5 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් සංවර්ධන නිලධාරිනියකට ලබා දී තිබුණු අංක 5CD6434C51 දරන ලැප්ටොප් පරිගණකය කාර්යාලයට භාර නොදී එම නිලධාරිනිය විදේශ ගත වී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එය නැවත භාර නොදීම සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) මාදම්පේ ප්‍රාදේශීය ලේකම්වරිය විදේශ නිවාඩු ලබා දිවයිනෙන් බැහැර ගොස් තිබුණු නමුත් නිල රථය යලි කාර්යාලයට භාර නොදී දිස්ත්‍රික් ලේකම්ගේ අවසරයකින් තොරව නිවසේ කටයුතු සඳහා යොදාගෙන තිබියදී දිට්වා සුළි කුණාටුවෙන් ඇති වූ ජල ගැලීමෙන් හානියට පත් වී තිබුණි. එම රථය ප්‍රසම්පාදන කටයුත්තකින් තොරව අලුත්වැඩියා සඳහා භාර දී තිබුණ අතර ඒ සඳහා රු.377,000 ක ට අධික මුදලක් වැය වෙතැයි ඇස්තමේන්තු කර තිබුණි. මේ සම්බන්ධයෙන් මු.රෙ.104 ප්‍රකාර විධිමත් පරීක්ෂණයක් පවත්වා අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2025 වර්ෂය තුල අලාභහානි ලෙස හඳුනාගෙන තිබුණු සිදුවීම් 08 ක් සම්බන්ධව මු.රෙ.104 ප්‍රකාරව පරීක්ෂණ පවත්වා අලාභයේ වටිනාකම තක්සේරු කර වගකිව යුත්තන් නිශ්චය කර අයකර ගැනීමට හෝ අධිකාරී බලය සහිතව පොත්වලින් කපා හැරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සිදුවූ වාහන අනතුරු 06 ක් සම්බන්ධව අලාභයේ වටිනාකම රු.1,288,177 ක් ලෙස හඳුනාගෙන තිබුණද, එම අනතුරු සිදුවී මාස 08 සිට වසර 19 ක් පමණ කල් ගතවී තිබුණද මු.රෙ.104 ප්‍රකාරව කටයුතු කර තක්සේරු කර තිබූ අලාභයේ වටිනාකම අයකර ගැනීමට හෝ වගකිව යුත්තන් නිශ්චය කල නොහැකි අවස්ථාවල අදාල විධිවිධාන ප්‍රකාරව කටයුතු කර විධිමත් අධිකාරී බලයක් යටතේ පොත්වලින් කපා හැරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු වාහනයක් 2013 ජූලි 05 දින අනතුරට ලක්වීමට අදාලව හානි පාඩු ලේඛනයේ දක්වා තිබූ අලාභයේ වටිනාකම හා මූල්‍ය ප්‍රකාශනයේ ඇමුණුම් (II) පොත්වලින් කපාහැරීම පිළිබඳ ප්‍රකාශය යටතේ දක්වා තිබූ අලාභයේ වටිනාකම අතර රු.46,508 ක වෙනසක් පැවතුණි.

4.6 විගණන විමසුම් සඳහා පිලිතුරු ලබා නොදීම

ජාතික විගණන කාර්යාලය මගින් 2025 වර්ෂයට අදාළව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 ක් පිළිබඳ සිදුකළ විගණනයේ දී 2026 අප්‍රේල් 21 දිනට විගණන විමසුම් 28 ක් යවා තිබුණි. ඉන් විමසුම් 13 ක් සඳහා පිළිතුරු ලැබී නොතිබූ අතර ප්‍රමාද කාලය දින 05 සිට දින 202 දක්වා පරාසයක විය.

4.7 කළමනාකරණ දූර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මහවැව, පුත්තලම, වනාතවිල්ලුව, ආණමඩුව සහ දංකොටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගබඩාවල කාලයක් තිස්සේ භාවිතා නොවන ගබඩා තොග වර්ග 36 ක තොග අයිතම 116 ක් පිළිබඳව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහන යටතේ 2020/2021 වර්ෂ වල වී සහල් බවට පත් කිරීමේ දී සහල් මෝල් හිමියන් 20 ක ගෙන් 2025 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 93.98 ක මුදලක් අය විය යුතුව තිබුණු නමුත් රජය ලබා දුන් සහන කාල සීමාව තුළ අය විය යුතු රු.මිලියන 26.26 ක මුදලින් ද රු.මිලියන 4.70ක් පමණක් අයවී තිබුණි. නෛතික ක්‍රියාමාර්ග ගෙන ඉතිරි මුදල් නිසි පරිදි අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) චෙක්පත් භාරදීමේදී චෙක්පත් භාරගන්නා පාර්ශවයෙන් ඒවා භාරගත් බවට සනාථ වන පරිදි අත්සන ලබාගෙන චෙක්පත් භාරදිය යුතු වුවත් පල්ලම හා මහවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල අවස්ථා 17 ක දී භාර දුන් රු.757,654 ක් වටිනා චෙක්පත් සඳහා එපරිද්දෙන් කටයුතු කර නොතිබුණි.

(ඈ) පල්ලම, කරුවලගස්වැව, වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල කැබ් රථ 06 ක් හා රු. මිලියන 11.1 ක් වටිනා ට්‍රැක්ටර් 09 ක් වසර 04 සිට 05 දක්වා කාලයක් තිස්සේ නිෂ්කාර්යව විනාශ වෙමින් පැවතුණි.

(ඉ) පල්ලම සහ මහකුඹුක්කඩවල ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල අනුමත බොරළු වලවල් 60 ක් සඳහා බලපත්‍ර ලබා දීමේදී පතල් හා පුනරුත්ථාපන සැලැස්ම අනුව ඒවා යලි වසා දමා පාරිසරික හානි අවම වන ලෙස හා ජන ජීවිතයට බලපෑමක් නොවන පරිදි කළ යුතු බවට දක්වා තිබුණ ද, එසේ සිදු නොකිරීමෙන් එකී ප්‍රදේශවලට දැඩි පාරිසරික හානියක් ඇතිව තිබුණි.

(ඊ) පුත්තලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් 2006 – 2019 කාලයේ යලි පුබුදමු ශ්‍රී ලංකා ව්‍යාපෘතිය මගින් පුද්ගලයන් 12 දෙනෙකු සඳහා රු.632,500 ක ණය මුදලක් ලබා දී තිබුණ අතර ඉන් රු.294,565ක් නැවත අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(උ) කාන්තා හා ළමා කටයුතු අමාත්‍යංශය මගින් ලබා දුන් ප්‍රතිපාදන මත වනාතවිල්ලුව, මහකුඹුක්කඩවල සහ ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් 2017 හා 2022 වර්ෂ වල චක්‍රිය ණය ලබා දී තිබුණු අතර ඉන් රු.364,312 ක ණය මුදලක් යලි අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2008 අගෝස්තු 20 දිනැති අංක 2008/04 දරන රජය සතු ඉඩම් අනවසරයෙන් අල්ලා ගැනීම පාලනය කිරීම හා කළමනාකරණය කිරීම විධිමත් කිරීම මැයෙන් වූ චක්‍රලේඛයේ (iii) කොටසේ 3.3 ඡේදය ප්‍රකාරව අනවසර අල්ලා ගැනීම්, ඉදිකිරීම් පිළිබඳව ක්‍රියාමාර්ග ගත යුතු වුවත් වනාතවිල්ලුව හා කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල එපරිද්දෙන්

අනවසරයෙන් අල්ලාගෙන ඇති ඉඩම් අක්කර 1,360 ක් සම්බන්ධයෙන් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(එ) රජයේ සංවර්ධන කටයුතු සඳහා වෙනත් රාජ්‍ය ආයතන වලින් ඉඩම් පැවරීම් සිදු කරන ලෙස කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලැබී තිබුණ ඉල්ලීම් 41 ක් සම්බන්ධ කටයුතු සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අවසන් ව නොතිබුණි.

(ඒ) මහකුඹුක්කඩවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී වසම් 11 කට වන අලි තර්ජන පවතින අතර 2023-2025 කාල පරිච්ඡේදය තුළ මනුෂ්‍ය ඝාතන 02 ක් සිදු වී රු. මිලියන 2 කට අධික අලාභයක් සිදුව තිබුණද එම ගැටලුවට තිරසාර විසඳුම් ලබා දීමට කටයුතු නොකිරීමෙන් මහජනතාව මෙන්ම රාජ්‍ය නිලධාරීන්ද දැඩි අවධානමකට ලක්ව තිබුණි.

(ඔ) පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ආපනශාලාව වාර්ෂිකව රු.97,200 ක බදු මුදලකට ටෙන්ඩර්කරුවකු වෙත ලබා දී තිබුණු අතර එහි ආදායම රජයේ ආදායමට බැර නොකර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සුභසාධන අරමුදලට බැර කර තිබුණි. ආපන ශාලාව බදුදී වසර 02 කාලසීමාවක් ගතව ඇතත්, නැවත ටෙන්ඩර් කිරීමට ද කටයුතු කර නොතිබුණි.

(ඕ) මුන්දලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය කල නිලධාරියෙකු මියගොස් වසර 02 මාස 03 ක කාලයක් ගත වී ඇතත්, රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 262/2017 හා 2017 දෙසැම්බර් 29 දිනැති චක්‍රලේඛයේ 03 හා 04 ඡේදය ප්‍රකාරව ඔහුගෙන් අයවිය යුතු රු.243,840 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ක) රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 262/2017 හා 2017 දෙසැම්බර් 29 දිනැති චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව විශ්‍රාම ගිය නිලධාරීන්ගේ වැටුප් අයදුම්පත්‍ර (පීඩී03/පීඩී05) සඳහා නිවැරදි තොරතුරු ඇතුලත් කිරීම් හා 2018 ජනවාරි 01 සිට විශ්‍රාම පාරිතෝෂිකයෙන් ණය මුදල නොපමාව අයකර ගැනීමට ගණන්දීමේ නිලධාරීයා කටයුතු කලයුතු වුවත්, විශ්‍රාම ගිය නිලධාරීන් 08 දෙනෙකුගෙන් අයවිය යුතු රු.1,129,478ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ග) රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 05/2019 හා 2019 ජුනි 27 දිනැති චක්‍රලේඛයේ 03(ඉ) ඡේදය ප්‍රකාරව වැඩ තහනම් කල නිලධාරීන් දෙදෙනෙකුගෙන් රු.167,200 ක් හා සේවය හැර ගොස් ඇති නිලධාරීන් 05 දෙනෙකුගෙන් රු.563,290 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ජ) වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කාර්යාල කාර්යය සහායක තනතුරෙහි සේවයේ යෙදී සිට 2009 ඔක්තෝබර් 26 දින සේවය අතහැර ගිය අයෙකුගේ ණය ශේෂය 2025 මාර්තු 03 දින සිට රු.5,000 ක් බැගින් මාස්පතා ගෙවීමට පොරොන්දු වී තිබුණ ද, 2025 දෙසැම්බර් 31 දින වනවිටත්, හිඟ ණය ශේෂයෙන් රු.12,000 ක මුදලක් පමණක් ගෙවා ඇති අතර ඉතිරි රු.100,800 ක ණය ශේෂයක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ට) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 187 ප්‍රකාරව මුදල් භාර ගැනීමේ කාර්යාල වලට ලැබෙන මුදල් දිනපතා හෝ හැකිතාක් අප්‍රමාදව, දෙපාර්තමේන්තුව නමින් පවත්වාගෙන යන බැංකු ගිණුමේ තැන්පත් කළ යුතු වුවත් පල්ලම හා කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි රු.517,795 ක මුදල් දින 03 ත් 08 ත් අතර බැංකුගත කිරීමට ප්‍රමාද වී තිබුණි.

(ඩ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා මහවැව, ආණමඩුව, නාත්තන්ඩිය, මාදම්පේ සහ දංකොටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල විශ්‍රාම වැටුප් ගෙවීමේ දී විශ්‍රාමිකයන් 57 දෙනෙකු වෙත රු.11,989,350 ක් වැඩිපුර ගෙවා තිබුණු අතර එකී මුදල් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් මියගිය විශ්‍රාමික නිලධාරීන් 09 දෙනෙකු වෙනුවෙන් වැඩිපුර ගෙවා ඇති රු.658,552 ක මුදලක් යළි අයකර ගැනීමට නොහැකි ව පැවතුණි.

05. තිරසර සංවර්ධනය

2030 වසර වනවිට තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ප්‍රගතිය පරීක්ෂා කිරීමේ දී ආහාර පෝෂණ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සියයට 21 ක ද සෞඛ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සියයට 43 ක ද , වැසිකිළි නොමැති පවුල් සඳහා වැසිකිළි ලබාදීමේ වැඩපිළිවෙල සියයට 16 ක ද, රැකියා අවස්ථා ඇති කිරීමේ වැඩසටහන්වල ප්‍රගතිය සියයට 29 ක ද, පාසැල් හැර යන අය කුසලතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සියයට 15 ක ද, කුඩා ව්‍යාපාර බිහි කිරීමේ වැඩසටහන් සියයට 37 ක සහ රුක්රෝපණ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සියයට 10 ක් වැනි අඩු මට්ටමක ප්‍රගතියක් ලබාගෙන තිබුණි.

06. යහපාලනය

6.1 මහජනයා වෙත සේවා ඉටු කිරීම

2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව සේවාලාභී ප්‍රඥප්තිය පිලියෙල කර ක්‍රියාත්මක කළ යුතු වුවත් පල්ලම, නවගත්තේගම,පුත්තලම, මුන්දලම, වනාතවිල්ලුව හා මහවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල එවැනි පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් ප්‍රදර්ශනය කර නොතිබුණි.

6.2 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන අංශයේ 2025 වාර්ෂික විගණන සැලැස්ම අනුව අවධානම් සහගත විගණන ක්ෂේත්‍ර 57 ක් හා සාමාන්‍ය විගණන ක්ෂේත්‍ර 18 ක් හඳුනාගෙන තිබුණද, සාමාන්‍ය විගණන පරීක්ෂා 03 ක් පමණක් ඉටුකර තිබුණ අතර වර්ථමාන කාර්යසාධන වාර්තාවක්ද සමාලෝචිත වර්ෂයට ඉදිරිපත් කිරීමට අපොහොසත් ව තිබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

6.3 විගණන හා කළමනාකරණ කමිටුව

කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMA/01-2019 හා 2019 ජනවාරි 12 දිනැති කළමනාකරන චක්‍රලේඛයේ 5.3 ඡේදය ප්‍රකාරව වාර්ෂිකව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් අවම වශයෙන් කාර්තුවකට වරක් එනම් වර්ෂයකට 04 ක් වන පරිදි පැවැත්විය යුතු වුවත් පුත්තලම දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 න් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 09 ක රැස්වීම් 03 ක් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක රැස්වීම් 02 ක් බැගින් ද පවත්වා තිබුණි.

07. මානව සම්පත් කළමනාකරණය

7.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 හි ජ්‍යෙෂ්ඨ මට්ටමේ අදාලව තනතුරු 04 ක නිලධාරීන් 33 ක් ද, තෘතීයික මට්ටමේ තනතුරු 03ක නිලධාරීන් 17 ක් ද, ද්විතියික මට්ටමේ තනතුරු 07ක නිලධාරීන් 206 ක් ද පුරප්පාඩුව පැවතුණ අතර, ද්විතියික මට්ටමේ සංවර්ධන නිලධාරීන් අනුමත ප්‍රමාණය ඉක්මවා 78 ක් පමණ දිගින් දිගටම අතිරික්ත සිටින තත්ත්වයක් තුළ එය කළමනාකරණයට සුදුසු ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි.

එම්.ජී.මදරසිංහ,
නියෝජ්‍ය විගණකාධිපති,
විගණකාධිපති වෙනුවට.

එම්.ජී. මදරසිංහ
නියෝජ්‍ය විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

# 4. පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක

## 4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක ( ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව )

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක්(%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | **75% - 100%** | **50% - 74%** | **0% - 49%** |
| මානව සම්පත් සංවර්ධන දේශිය හා විදේශිය පුහුණුව | | 59% | |
| ප්‍රසම්පාදන සැලැස්ම අනුගතවීම | 87% | | |
| වාර්ෂික ඇස්තමේන්තු තුළින් සපයා ගන්නා ප්‍රතිපාදන ප්‍රශස්ත උපයෝජනය | 86% | | |
| දිස්ත්‍රික්කයට ලැබෙන සියළුම මූල්‍ය ප්‍රතිපාදන අපේක්ෂිත ඉලක්ක කරා මෙහෙයවීම | 85% | | |
| ප්‍රතිපාදන අරපිරිමෙස්මෙන් හා කාර්යක්ෂමව මෙහෙයවීම සම්බන්ධව අභ්‍යන්තර පාලනය | 95% | | |
| හරිතඵලදායිතාව සහ පොලිතින් රහිත පරිසරය | 90% | | |
| තාක්ෂණය සහ මෘදුකාංග භාවිතය | 95% | | |
| ආදායම් උත්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මකවීම | 90% | | |
| පරිසර සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | 90% | | |



## 05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

තිරසාර සංවර්ධනයේ මූලික පරමාර්ථය වන්නේ ජාතියක ස්වභාවික සම්පත් වර්තමානයේදී ඵලදායී ලෙස කළමනාකරණය කරමින් අනාගත පරපුර සඳහා සංරක්ෂණය කිරීමයි. මේ අනුව, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන 2015 දී තිරසාර සංවර්ධන ඉලක්ක (SDG) 17ක් එළිදක්වන ලද අතර, ඒවා 2030 වන විට සාමාජික රටවල් 193ක් විසින් ඉටු කිරීමට නියමිත අතර ක්ෂේත්‍ර 17ක් පුරා විහිදේ. එබැවින්, මානව, සමාජීය, ආර්ථික සහ පාරිසරික අංගවල මූලික කුළුණු එකට ගැටගැසීමෙන්, පාරිසරික තිරසාරත්වය, සමාජ තිරසාරභාවය සහ ආර්ථික සංවර්ධනය තුළින් තිරසාර සංවර්ධනයක් කරා ආර්ථිකයන් මෙහෙයවීම ඉලක්කය වේ. රාජ්‍ය අංශය, රාජ්‍ය නොවන සංවිධාන සහ ජාත්‍යන්තර සංවිධාන සමඟ එක්ව, වසර 2030 වන විට තිරසාර සංවර්ධනයේ ඉලක්ක සහ ඉලක්ක සපුරාලීමට ශ්‍රී ලංකාව මූලිකත්වය ගනිමින් සිටී.

ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා ආයෝජන කඩිනම් කිරීම, ප්‍රමුඛතා අංශ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් " සෑම තැනකම සංවර්ධන උපාය මාර්ග මෙහෙයවීම මෙම SDG හි මූලික හා ප්‍රමුඛතම ඉලක්කය සපුරා ගැනීම සඳහා අවශ්‍ය වේ.

### 5.1 හඳුනා ගන්නා ලද අදාල තිරසාර සංවර්ධන අරමුණු

| අනුඅංකය | ඉලක්කය/ අරමුණ | ඉලක්කය | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණය ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0%-49% | 50% 74% | 75%-100% |
| 1 | සෑම තැනකම සෑම ආකාරයකම දරිද්‍රතාව තුරන් කිරීම | සියළුම ආකාරයේ දරිද්‍රතාවයන්ගෙන් පෙළෙන සියළුම වයස් කාණ්ඩවලට අයත් පිරිමින් කාන්තාවන් හා ළමුන්ගේ අනුපාතය 2025 වනවිට අවම වශයෙන් අඩකින් අඩු කිරීම | දරිද්‍රතාවෙන් පෙලෙන පවුල්වල රැකියා අපේක්ෂිත තරුණ තරුණියන් (971/812) ක් රැකියා ගත කිරීම | | | 120% |
| | | | පුහුණු වැඩසටහන් (485/447) ක් පැවැත්වීම | | | 109% |
| | | | ව්‍යාපාර ආරම්භ කිරීමට ණය ලබා දීම - (1254/1480) | | | 85% |
| | | | පවුල් ආදායම් උත්පාදනයට යොමු කිරීම ගෘහ ඵලදායිතා වැඩසටහන් (178 /478) පැවත්වීම | 37% | | |
| | | | මත් නිවාරණ දැණුවත් කිරීම් වැඩසටහන් (276/333) ක් පැවැත්වීම | | | 83% |
| | | | පුද්ගලයින් වෙතට ස්වයං රැකියා ආධාර (325/483) ලබා දීම හා යොමු කිරීම | | 67% | |
| | | | ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් (1353/588) ක් පැවැත්වීම | | | 230% |
| | | | ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන් (275/275) පැවැත්වීම | | | 100% |
| | | | විගමනික පවුල්වල සාමාජිකයන්ව මූල්‍ය කළමණාකරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ( 12/16) ක් පැවැත්වීම | | | 75% |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 2 | සාගින්න දුරලීම, ආහාර සුරක්ෂිතතාවය හා ඉහල පෝෂණ තත්ත්වයක් සාක්ෂාත් කර ගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම | 2030 වර්ෂය වන විට සාගින්න තුරන් කිරීම සහ විශේෂයෙන් දරුවන් ද ඇතුලත්ව දරිද්‍රතාවයෙන් පෙළෙන හා අවධානමට ලක්ව තිබෙන ජනතාවට ආරක්ෂාකාරි පෝෂණයෙන් යුත් ප්‍රමාණවත් ආහාර වසර පුරා ලබා ගැනීමට හැකි බව තහවුරු කිරීම | ආහාර හා පෝෂණය පිළිබඳව දැනුවත් කිරීමම වැඩසටහන් (529/571) පැවැත්වීම | | | 93% |
| | | | පස හා ජල සංරක්ෂණය තුලින් ඌන පරිහරන කෘෂිකාර්මික ඉඩම්වල ඵලදායිතාව ඉහල නැංවීමේ වැඩසටහන් (30/35) ක් පැවැත්වීම | | | 86% |
| 3 | නිරෝගී ජීවිතයක් තහවුරු කිරීම සහ සෑම වයසකදීම යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම | 2030 වර්ෂය වන විට සාගින්න තුරන් කිරීම සහ විශේෂයෙන් දරුවන් ද ඇතුලත්ව දරිද්‍රතාවයෙන් පෙළෙන හා අවධානමට ලක්ව තිබෙන ජනතාවට ආරක්ෂාකාරි පෝෂණයෙන් යුත් ප්‍රමාණවත් ආහාර වසර පුරා ලබා ගැනීමට හැකි බව තහවුරු කිරීම | මද්‍යසාර හා මත් ද්‍රව්‍ය භාවිතය අවම කිරීම සහසාරධර්ම අධ්‍යාපනය පිළිබඳ දැනුවත් කිරීම වැඩසටහන් (21/21) ක් පැවැත්වීම | | | 100% |
| | | | ක්‍රීඩා තරඟ (54/62) ක් පැවැත්වීම | | | 87% |
| | | | වෛද්‍ය සායන (335/202)ක් පැවැත්වීම | | | 166% |
| | | | ග්‍රාමීය ක්‍රීඩාපිටි (5/9) ක් සංවර්ධනය | | 56% | |
| | | | ක්‍රීඩා උපකරණ ලබාදීම සහ ක්‍රීඩා පුහුණුව (18/18) ක් සිදු කිරීම | | | 100% |
| 4 | පරිපූර්ණ,සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් ලැබීම තහවුරු කිරීම සහ සෑමට ජීවිත කාලය පුරාම අධ්‍යාපනය ලැබීමේ අවස්ථාව ප්‍රවර්ධනය කිරීම. | 2030 වන විට ඵලදායී ඉගෙනුම් ප්‍රතිඵල ලබා ගැනීමට හැකිවන ආකාරයෙන් සියළුම ගැහැණු ළමුන් හා පිරිමි ළමුන් නිදහස් සමාන සහ ගුණාත්මකභාවයෙන් ඉහළ ප්‍රාථමික හා ද්විතීක අධ්‍යාපනයක් සම්පූර්ණ කර සිටින බව තහවුරු කිරීම | ද්විතීය අධ්‍යාපනයෙන් පසු තරුණ තරුණියන් (2919/2784) දෙනෙක් ඵලදායී තෘතීය අධ්‍යාපනයට යොමු කිරීම | | | 105% |
| | | | සිසුන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශ (15595 /14900)ක් ලබා දීම | | | 105% |
| | | | දැනුවත් කිරීමේ වැඩසටහන් (1087/1026) ක් පැවැත්වීම | | | 106% |
| | | | ශිෂ්‍යත්ව ප්‍රතිලාභ (544/643) ක් ලබා දීම | | | 85% |
| 5 | ස්ත්‍රී, පුරුෂ සමානාත්මකතාවය අත්පත් කර ගැනීම සහ සියළු කාන්තාවන් සහ ගැහැණු ළමයින් සවිබල ගැන්වීම. | කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහිව සියළුම ස්ථානවල සිදු වන්නා වූ සියළුම ආකාරයකම වෙනස්කොට සැලකීම් තුරන් කිරීම. | හිංසනයට මුහුණ දෙන්නන් වෙනුවෙන් මනෝ සමාජීය උපදේශන සහාය වැඩසටහන් (18/15) ක් පැවැත්වීම | | | 120% |
| | | | විගමනික පවුල්වල සාමාජිකයන්ට දරුවන්ගේ සුරක්ෂිත තාවය සම්බන්ධව දැනුවත් කිරීම වැඩසටහන් (121/100) ක් පැවැත්වීම | | | 121% |
| | | | පාසල තුල ළමා ආරක්ෂක කමිටු ස්ථාපිත කිරීම (42/50) | | | 84% |
| 6 | සෑමට ජලය සහ සනීපාරක්ෂක පහසුකම් | 2030 වන විට සියළු දෙනාටම සමානත්වයෙන් යුක්තව | රාජ්‍ය නොවන සංවිධානවල අවධානයට යොමු කර පවුල් (500/505) ක් සඳහා අවශ්‍ය පහසුකම් | | | 99% |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | ලබාගැනීම සහ ඒවායේ තිරසර කළමනාකරණය සහතික කිරීම . | සනීපාරක්ෂාව සහ ස්වස්තතාව ලබා ගැනීමට හැකියාව සහ එළිමහනේ මළපහ කිරීම තුරන් කිරීම සහ විශේෂයෙන්ම කාන්තාවන්ගේ, ගැහැණු ළමුන්ගේ සහ අවධානමට ලක් වී සිටින පුද්ගලයන්ගේ විශේෂ අවශ්‍යතාවයන් කෙරෙහි අවධානය යොමු කිරීම . | සැපයීම | | | |
| | | | පාසල් දරුවන් හා වැඩිහිටියන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම - ප්‍රතිලාභින් (128/128) | | | 100% |
| 7 | සියල්ලන් සඳහා දැරිය හැකි විශ්වාසනීය,තිරස ර සහ නවීන බලශක්ති සැපයුම සහතික කිරීම | 2030 වන විට සියළු දෙනාටම අඩු මිලකට ලබා ගත හැකි විශ්වාසදායි නවීන බලශක්ති මූලාශ්‍රවලට ප්‍රවේශ විය හැකි බව තහවුරු කිරීම. | ගොවි බිම් සඳහා සූර්ය බලයෙන් ක්‍රියා කරන වතුර මෝටර් (04/05)ක් සැපයීම | | | 80% |
| 8 | සියල්ලන් සඳහාම පෝෂිත පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ ඵලදායිව සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම. | ළමා ශ්‍රමය තහනම් කිරීම, කම්කරු අයිතීන් සුරක්ෂිත කිරීම, සියළු සේවකයන් සඳහා ආරක්ෂාකාරි සේවා පරිසරයක් තිබීම ප්‍රවර්ධනය කිරීම | වෘත්තීය මාර්ගෝපදේශ සේවා ලබා දීම හා ව්‍යවසායකත්ව සංවර්ධනය - වැඩසටහන් (1727/1788) | | | 97% |
| | | | වයස අවු 18-60 ත් අතර පුද්ගලයන් හඳුනාගෙන රැකියා අවස්ථාව සැලසීම සඳහා පුහුණු වැඩසටහන් (229/210) ක් පැවැත්වීම | | | 109% |
| | | | වැඩිහිටි ව්‍යවසායකයන්ගේ තොරතුරු ලබාගැනීම හා හඳුනාගැනීම -( 6/10) | | 60% | |
| | | | ළමා ආරක්ෂණ ජාලයක් ග්‍රාමීය මට්ටමින් ස්ථාපිත කිරීම -( 325/558) | | 58% | |
| 9 | සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම, පරිපූර්ණ සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරි ගැන්වීම. | සංවර්ධන වෙමින් පවත්නා රටවල දේශීය තාක්ෂණ සංවර්ධනය,පර්යේෂණ සහ නවෝත්පාදනය සඳහා සහය ලබා දීම, එකිනෙකා අතර කර්මාන්ත විවිධාංගිකරණය සහ නිෂ්පාදනයන් සඳහා වටිනාකම එකතු කිරීම සඳහා යෝග්‍ය ප්‍රතිපත්ති වාතාවරණයක් සැකසීම | තාක්ෂණික පුහුණුවීම් සඳහා යොමු කිරීම- (193/40) | | | 483% |
| | | | දේශීය තාක්ෂණික සංවර්ධනයන්ට පුද්ගලයන් වෙත මූල්‍යාධාර සැපයීම- (50/42) | | | 119% |
| | | | පුද්ගලයන්ට( 81/81) ක් වෙළඳපලට පිවිසීමට අවශ්‍ය සහය ලබාදීම | | | 100% |
| | | | යටිතල පහසුකම් සංවර්ධනය - (157/160) | | | 98% |
| | | | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යසායකින් බිහිකිරීම අරමුණින් Business Desk වැඩසටහන ක්‍රියාත්මක කිරීම - (80/80) | | | 100% |
| | | | පාසල් හැරයන තරුණ තරුණියන් වෘත්තිමය කුසලතා වර්ධනයට උපායමාර්ගික සැලැස්ම(Lead to Leed) ක්‍රියාත්මක කිරීම - 2657 | | | 100% |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 11 | නගර හා ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත,සවිමත් සහ තිරසර ලෙස සකස් කිරිම. | 2030 වන විට විශේෂයෙන්ම වාතයේ ගුණාත්මකභාවය සහ නාගරික සහ වෙනත් අපද්‍රව්‍ය කළමනාකරණය ඇතුලත්ව නගරය නිසා සිදුවන ඒක පුද්ගල අහිතකර බලපෑම අඩු කිරිම. | පොලිතින් හා ප්ලාස්ටික් භාවිතය 50 % න් අවම කිරීම -(128/128) | | | 100% |
| 12 | තිරසර පරිභෝජන සහ නිෂ්පාදන රටාවන් සහතික කිරීම. | 2030 වන විට අප ද්‍රව්‍ය උත්පාදනය වීම වැලැක්වීම , අඩු කිරීම, ප්‍රතිචක්‍රීයකරණය සහ ඒවා නැවත භාවිතා කිරීම මඟින් අඩු කිරීම | ආයතනික, කොට්ඨාස හා දිස්ත්‍රික්ක මට්ටමින් ව්‍යාපෘති (16/16) ක් සිදු කිරීම | | | 100% |
| | | | පරිසර සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම - (16/16) | | | 100% |
| 13 | දේශගුණික විපර්යාස සහ ඒවායේ බලපෑම්වලට එරෙහිව කඩිනමින් ක්‍රියාත්මක කිරීම. | දේශගුණික බලපෑම්වලට ලක්වන පවුල් ප්‍රමාණය වාර්ෂිකව 10% දක්වා අඩුකිරීම | ගංවතුර නිසා නිරන්තර සිදුවන හානි අවම කිරීමට අවශ්‍ය සංවර්ධන ව්‍යාපෘති (05/05) ක් ක්‍රියාත්මක කිරීම | | | 100% |
| 15 | භූගෝලීය පරිසර පද්ධතින්ගේ තිරසර භාවිතය, තිරසර වනාන්තර කළමනාකරණය, කාන්තාරිකරණය ට එරෙහිව ක්‍රියාකිරීම, ප්‍රතිස්ථාපනය කර ආරක්ෂා කර ප්‍රවර්ධනය කිරීම ඉඩම් හායනය නැවැත්වීම සහ පුනරුත්ථාපනය සහ ජෛව විවිධත්ව විනාශය නැවැත්වීම. | උපත් ලියාපදිංචි කිරීමද ඇතුළුව 2030 වන විට සියළු දෙනාටම නීතිමය අනන්‍යතාවක් ලබාදීම | ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් (77/46) ක් ක්‍රියාත්මක කිරීම | | | 167% |

## 5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

**අභියෝග**

1. දරිද්‍රතාවය ඉහල යාමට, සෞඛ්‍ය සම්පන්න නිරෝගී ජීවිත අහිමි වීමට, ගුණාත්මක අධ්‍යාපනයක් අහිමි වීමට ආදී වූ කරුණු රාශියකට හේතුවක් වූ මත්පැන් හා මත්ද්‍රව්‍ය භාවිතය අවම කිරීමට විවිධ වූ දැනුවත් කිරීම් වැඩසටහන් පැවැත්වූවද මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වන පිරිස දිනෙන් දින වැඩිවීම සිදුව ඇත.
2. සියළුම ජනතාවට ආරක්ෂිත පෝෂ්‍යදායි ප්‍රමාණවත් ආහාර ලැබීම තහවුරු කිරීම සාක්ෂාත් කිරීමේ දී ප්‍රබල ගැටළුවක්ව පවතින්නේ වසරේ වැඩි කාලයක් වියළි දේශගුණයක් පවතින පුත්තලම දිස්ත්‍රික්කය තුල ඇතිවන නියඟ තත්වය නිසා ගොවිතැන් විනාශ වීම සහ සතුන් විසින් ගොවිතැනට හානි කිරීම.
3. මධ්‍යම පළාතට, කුරුණෑගල දිස්ත්‍රික්කයට හා අනුරාධපුර දිස්ත්‍රික්කය යන ප්‍රදේශ වලට ඇදහැලෙන අධික වැසි ජලය පුත්තලම දිස්ත්‍රික්කය හරහා මුහුදට ගලා බසියි. පුත්තලමට අධික වැසි ඇති නොවූවද දිස්ත්‍රික්කයේ පවතින භූගෝලීය පිහිටීම නිසා ගංවතුර ආපදාවන්ට නිරන්තරයෙන් මුහුණ දීමට සිදුවීම අභියෝගයකි

## 6 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

### 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| ශ්‍රේණිය | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු / (අතිරික්ත)** |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 80 | 52 | 28 |
| තෘතියික | 39 | 35 | 04 |
| ද්විතියික | 1,814 | 1,559 | 255 |
| ප්‍රාථමික | 178 | 148 | 30 |




### 6.2 ** ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

දැනට පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා අදාළ අංශ වෙත තොරතුරු දැනුම් දී ඇත. ජ්‍යෙෂ්ඨ සහ තෘතික පුරප්පාඩු තනතුර වලට අදාළ රාජකාරි කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට අභ්‍යන්තර වැඩපිළිවෙලක් යොදා ඇත. (රාජකාරි ආවරණ ,වැඩ බැලීම, රාජකාරි ඉටුකිරීම ) ද්වීතීයික නිලධාරින්ගේ පුරප්පාඩු සඳහා සංවර්ධන නිලධාරින් යොදවා රාජකාරි අඛණ්ඩව ක්‍රියාත්මක කරයි. ප්‍රාථමික පුරප්පාඩු තනතුර වලට අදාළ රාජකාරි කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට බහු කාර්‍ය නිලධාරින් යොදවා ඇත.

## 6.3 මානව සම්පත් සංවර්ධනය

| අනු අංකය | වැඩසටහන | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහන් කාල සීමාව(දින) | සමස්ථ ආයෝජනය | වැඩසටහන් ස්වභාවය (දේශීය/විදේශීය) | නිමැවුම්/ ලබා ගත් දැනුම* |
|---|---|---|---|---|---|---|
| 1 | ඵලදායිතා සංකල්ප පිළිබඳ පුහුණුව | 229 | 1 | 39,550 | දේශිය | ඵලදායිතා දැනුම වර්ධනය |
| 2 | ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව | 1 | 10 | 30,000 | දේශිය | ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ විධිමත් දැනුම |
| 3 | රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් සකස් කිරීම | 8 | 1 | 58,500 | දේශිය | ඵලධායිතාවය වැඩිවීම |
| 4 | ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධ පුහුණුව | 15 | 1 | 3,950 | දේශිය | අදාල විෂය සම්බන්ධව නිලධාරින් දැනුවත්වීම හා ඵලධායිතාවය වැඩිවීම |
| 5 | ප්‍රසම්පාදන මාර්ගෝපදේශන පිළිබඳ පුහුණු වැඩසටහන | 3 | 2 | 43,000 | දේශිය | ඵලධායිතා වැඩිවීම |
| 6 | ප්‍රාදේශීය ලේකම්-සමාජ විද්‍යා පශ්චාත් උපාධිය | 1 | අවු 01 | 102,500 | දේශිය | ඵලධායිතා වැඩිවීම |
| 7 | සහකාර ප්‍රාදේශීය ලේකම්-පශ්චාත් උපාධිය | 1 | අවු 01 | 150,000 | දේශිය | මානසික සෞඛ්‍ය වර්ධනය |
| 8 | මානසික සෞඛ්‍ය සේවය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | 175 | දින 01 | 15,600 | දේශිය | ඉඩම් රාජකාරී විධිමත් කිරීම |
| 9 | ඉඩම් රාජකාරී සම්බන්ධ පුහුණුව | 10 | 1 | 3,700 | දේශිය | ග්‍රාම නිලධාරී කටයුතු කාර්යක්ෂම කිරීම හා මහජන තෘප්තිය ඇති වන අයුරින් රාජකාරී කටයුතු සිදු කිරීම. |
| 10 | ග්‍රාම නිලධාරී රාජකාරී සම්බන්ධ පුහුණුව | 20 | 1 | 4,200 | දේශිය | නිවැරදි කාර්යාල ක්‍රම පිළිබඳ දැනුම වර්ධනය |
| 11 | කාර්යාල ක්‍රම පුහුණුව | 123 | 1 | 22,900 | දේශිය | ඵලධායිතා වැඩිවීම |
| 12 | කාර්යාල කළමනාකරණය හා මුදල් රෙගුලාසි | 16 | 2 | 192,000 | දේශිය | ධාරිතාවය වැඩිවීම |
| 13 | ආර්.ප්‍රභාකරන් මයා(සහකාර ප්‍රාදේශිය ලේකම්) ඒ.එච්.එම්.හෙට්ටිආරච්චි (ගණකාධිකාරි) මාස්ටර් උපාධිය | 2 | අවු 01 | 450,000 | දේශිය | මූලික විමර්ශනය පිළිබඳ දැනුම වැඩි වීම |
| 14 | මූලික විමර්ශනය | 5 | 1 | 32,500 | දේශිය | රාජකාරි කර ගැනීමේදී තාක්ෂණික දැනුම වර්ධනය |
| 15 | ක්ෂේත්‍ර රාජකාරි සඳහා තාක්ෂණය භාවිතා කිරීම හා AI තාක්ෂණයෙන් රාජකාරි පහසු කර ගැනීම | 89 | පැය 03 | 9,705 | දේශිය | ඵලධායිතාවය වැඩිවීම |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 16 | කාර්යාල නිලධාරින් සඳහා විගණන පුහුණුව | 50 | පැය 03 | 16000 | දේශිය | ඵලධායිතා වැඩිවීම |
| 17 | ගිණුම්කරණ කාර්යභාරය හා ප්‍රායෝගික භාවිතය | 8 | 1 | 63,000 | දේශිය | අදාල විෂය සම්බන්ධව නිලධාරින් දැනුවත්වීම |
| 18 | නිලධාරින්ගේ සාමාන්‍ය හැසිරීම හා විනය සම්බන්ධ පුහුණුව | 100 | 1 | 25260 | දේශිය | ඵලධායිතාවය වැඩිවීම |
| 19 | හානි පාඩු හා මු.රෙ.104 යටතේ වූ පරීක්ෂණය | 6 | 1 | 39000 | දේශිය | කාර්යාලීය ලිපි සම්බන්ධ කටයුතු වල ඵලදායිතාවය වැඩිවීම |
| 20 | ලිපිගොනුකරණය හා මුදල් රෙගුලාසි | 100 | 2 | 37,200 | දේශිය | ඵලධායිතාවය වැඩිවීම |
| 21 | ලිපි ගොනු කරණය සහ රාජකාරී ලිපි සැකසීම | 100 | 1 | 8,200 | දේශිය | ඵලධායිතාවය වැඩිවීම |
| 22 | රියදුරන් සඳහා එක් දින වැඩමුළුව | 4 | 1 | 24,500 | දේශිය | ඵලදායිතාවය වැඩිවීම |
| 23 | විගණන විමසුම් සඳහා පිළිතුරු | 1 | 1 | 6,500 | දේශිය | ඵලධායිතාවය වැඩිවීම |
| 24 | රාජ්‍ය පරිපාලන සහ කළමනාකරණ පශ්චාත් උපාධිය | 01 | අවුරුදු 01 | 225,000 | දේශිය | ඵලධායිතාවය වැඩිවීම |
| 25 | ප්‍රාදේශීය ලේකම්-පශ්චාත් උපාධිය | 1 | අවු 01 | 220,000 | | ඵලධායිතාවය වැඩිවීම |
| 26 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ | 1 | 1 | 12,000 | දේශීය | ඵලධායිතාවය වැඩිවීම |
| 27 | විනය කාර්ය පටිපාටිය සහතික පත්‍ර පාඨමාලාව | 1 | 10 | 25,000 | දේශීය | ඵලදායිතා දැනුම වර්ධනය |
| 28 | විධිමත් විනය පරීක්ෂණ ක්‍රියාවලිය | 2 | 2 | 24,000 | දේශීය | ඵලධායිතාවය වැඩිවීම |
| 29 | ලිපිගොනුකරණය | 2 | 1 | 13,000 | දේශීය | ඵලදායිතා දැනුම වර්ධනය |
| 30 | කාර්යාල සටහන් ලිවීම හා රාජකාරි ලිපි ලිවීම | 8 | 1 | 52,000 | දේශීය | ඵලධායිතාවය වැඩිවීම |
| 31 | කාර්යාල ඵලදායිතාව සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) සහ කෘත්‍රිම බුද්ධිය (AI) පිළිබඳ සහතික පත්‍ර වැඩසටහන | 2 | 5 | 60,000 | දේශීය | අදාල විෂය සම්බන්ධව නිලධාරින් දැනුවත්වීම හා ඵලධායිතාවය වැඩිවීම |
| 32 | රජයේ වාහන නඩත්තුව | 1 | 1 | 6,500 | දේශීය | |
| 33 | PL කාණ්ඩයේ නිලධාරීන් සඳහා දිස්ත්‍රික් මට්ටමින් පවත්වනු ලබන දෙදින පුහුණු වැඩසටහන | 155 | 2 | 126,760 | දේශීය | ඵලදායිතා දැනුම වර්ධනය |
| 34 | ගිනි නිවාරණය, හදිසි ගිනි අනතුරකදී ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳව නිලධාරීන් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන | | 1 | 8,100 | දේශීය | ඵලධායිතාවය වැඩිවීම |
| 35 | කාර්යාල සේවක සේවයේ නිලධාරීන් සඳහා වන පුහුණු වැඩසටහන | 14 | 1 | 14,735 | දේශීය | ඵලධායිතාවය වැඩිවීම |
| 36 | පෞද්ගලික ලිපිගොනුවක් ඵලදායී ආකාරයෙන් | 11 | 1 | 71,500 | දේශීය | ඵලධායිතාවය වැඩිවීම |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | පවත්වාගෙන යාම | | | | | |
| **37** | රජයේ වාහන නඩත්තුව | 1 | 1 | 6,500 | දේශීය | ඵලධායිතාවය වැඩිවීම |
| **38** | කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය 2023 යටතේ බඳවා ගත් , 2025 වර්ෂයේ පත්වීම් ලද නිලධාරීන් සඳහා සේවාරම්භක පුහුණු වැඩසටහන් | 23 | 5 | 78,248 | දේශීය | අදාල විෂය සම්බන්ධව නිලධාරින් දැනුවත්වීම හා ඵලධායිතාවය වැඩිවීම |
| **39** | ධාරිතා සංවර්ධන විශේෂ පුහුණු වැඩසටහන | 14 | 1 | 57,000 | දේශීය | ඵලදායිතා දැනුම වර්ධනය |
| **40** | අල්ලස් හා දූෂණ විරෝධි පනත පිළිබඳ නිලධාරින් දැනුවත් කිරීමේ වැඩසටහන | 235 | 1 | 138,255 | දේශීය | අදාල විෂය සම්බන්ධව නිලධාරින් දැනුවත්වීම හා ඵලධායිතාවය වැඩිවීම |

## 07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම) | අදාල නැත | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අදාල නැත | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අදාල නැත | | |
| 1.6 | වෙනත් | අදාල නැත | | |
| **2** | **පොත් පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | **අනුකූල නොවේ** | සිගාස් මඟින් යාවත්කාලීන කරමින් පවති. | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම. | අනුකූල වේ | | |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම. | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම. | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම. | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම. | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම. | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම. | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය ( GA – N 20) යාවත්කාලීන කර පවත්වා ගෙන යාම. | අනුකූල වේ | | |
| 03 | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.01 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| **4** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අය වැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂිකමුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| **5** | **විගණනවිමසුම්** | | | |

| | | | | |
|---|---|---|---|---|
| **5.1** | විගණනකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට,සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබාදී තිබීම | **අනුකූල නොවේ** | විගණන විමසුම් 36 කින් 07 ක් නියමිත දිනට ලබාදී ඇත. | |
| **6** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134(2) DMA/1-2019 අනුව ,වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව , අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | **අනුකූල නොවේ** | අදාළ වර්ෂය තුළ සිදු කර නැත | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම | **අනුකූල නොවේ** | අභ්‍යන්තර විගණන වාර්තාවන් 06ක් සඳහා මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා ඇත. | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **7** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේක 1-2019 අනුව , අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන යාම | **අනුකූල නොවේ** | අදාළ වර්ෂය තුළ සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලව ල කමිටු 04ක් පවත්වා නොමැත. | |
| **8** | **වත්කම් කළමනාකරණය** | | | |

| | | | | |
|---|---|---|---|---|
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේකයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම හා අපහරණය කිරීම පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම. | අදාල නොවේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වැනි පරිච්ඡේදය ප්‍රකාරව එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිළධාරියෙකු පත් කර එම නිළධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම | අදාල නොවේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල වේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම | අනුකූල වේ | | |
| **9** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම | අනුකූල වේ | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම | අනුකූල වේ | | |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | තිබීම | | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල වේ | | |
| **12** | **රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්ට අනුකූල වීම | අනුකූල වේ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල නොවේ | වසර ගණනාවකට පෙර සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ 04ක් ඇත.එම ණය ශේෂය කපා ගැනීමට අවශ්‍ය කටයුතු කරමින් තිබේ. | භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 118 අනුව ණය ගෙවීම් පියවනු ලැබේ. |
| **13** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම. | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | | |
| 14.2 | මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්ය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | **අනුකූල නොවේ** | ලියවිලි අඩුපාඩු හේතුවෙන් ප්‍රමාද වූ අවස්ථා කිහිපයක් පවතී | |
| 14.3 | මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | | |
| **15** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව , රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | අනුකූල වේ | | |
| 15.2 | රැස් කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | අනුකූල වේ | | |
| 15.3 | මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම | අනුකූල වේ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිළධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවා ලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක නර තිබීම | අනුකූල වේ | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවා ලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම් සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්මතුළ තහවුරු කොට තිබීම | අනුකූල වේ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල වේ | | |
| 19.4 | ඉහතචක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරවමානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම , ධාරිතාසංවර්ධනවැඩසටහන් සංවර්ධනය කිරීම , නිපුණතාසංවර්ධනවැඩසටහන්ක්‍රියාත්මක කිරීම පිළිබඳවගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම. | අනුකූල වේ | | |
| **20** | **විද්‍යුත් පළාත්පාලන පද්ධතියක් ස්ථාපිතකිරීම** | | | |
| 20.1 | 2018.07.19 දිනැතිපළාත් පාලන චක්‍ර ලේක අංක 2018/e-Local Government-01 අනුවඅන්තර්ජාලයහරහා අයදුම්පත්‍ර ඉදරිපත් කිරීමටපුරවැසියන්ට පහසුකම් සලසාතිබීම . | අදාල නොවේ | | |
| 20.2 | අන්තර්ජාලයහරහා ගෙවීම් සිදුකිරීමටපුරවැසියන්ට පහසුකම් සලසාතිබීම . | අදාල නොවේ | | |
| 20.3 | පාරිභොගින්ටහිතකර සේවාව සැපයීමෙ සඳහාපෙරටුකාර්යාලය හා (Front Offices) පාරිභොගික සේවා මධ්‍යස්ථානය හඳුන්වා දී තිබීම. | අදාල නොවේ | | |